ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"නමුත් අපි කුරුසියෙහි ඇණගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනාකරමුව....." (1 කොරින්ති 1:23)

82 වන වෙළුම අංක 02 (968) **2023 මාර්තු / අප්‍රේල්**

ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය

"නුවුත් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය ගැන විස වෙන කිසි දෙයක් ගැන පාර්ථිටු කරගන්ට මට නම් සිදුනොවේවා. ඒ කරුණුකොටගෙන ලෝකය මට ද මා ලෝකයට ද කුරුසිය යෙවි ඇණගසනු ලද්දේ විය. " (ගලාති :14)

"ඉනින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිවි. එනවි ලියවිලි ප්‍රකාරයට අපේ පවි නිසා ක්‍රිස්තුස් වහන්සේ මැරුණු බවත්,... " (1 කොරින්ති 15:3)

"මක්නිසාද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේ කුරුසියෙහි ඇණගසනු ලැබූ බවත් විනා වෙන කිසිවක් නුඹලා අතරෙහි නොදැන සිටින්ට නියම කර ගතිවි. " (1 කොරින්ති 2:2)

පාවුල් නිවැරදි බව ඔබට සහතික විය හැකිය. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසි මත රැඳී සිටින්න. පව්කාරයන්ට සමාවදීම සඳහා කුරුසිය මත ක්‍රිස්තුස් වහන්සේගේ මරණය මුළු බයිපලයේම කේන්ද්‍රීය වූ සත්‍යතාවය වේ. අපි උත්පත්ති පොත විවෘත කරන විට, අපි ආරම්භ කරන්නා වූ සත්‍යතාවය මෙයයි. සර්පයාගේ හිස පොඩි කරන ස්ත්‍රියගේ බීජය අන්කිසිවක් නොව කුරුසියේ ඇණ ගසනු ලබන ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අනාවැකියයි. මෝසෙස්ගේ ව්‍යවස්ථාව සහ යුදෙව්වරුන්ගේ ඉතිහාසය තුලින් වැසී ගියද බැබළෙන සත්‍යතාවය මෙයයි. දිනපතා කරන ලද පූජාවන්, පාස්කු බැටළුවා පූජාකිරීම, මණ්ඩපයේ සහ දේවමාළිගාවේ පූජාවලින් කරන ලද අඛණ්ඩ ලේ වැගිරීම සහ මේ සියල්ලම කුරුසියේ ඇණගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේගේ සංඛේත විය.

එළිදරව් පොත වසා දැමීමට පෙර ස්වර්ගයේ දර්ශනය තුළ ගෞරවයට පාත්‍ර වූ බව අප දකිනා සත්‍යතාවය මෙයි. **"තවද අං සතක් ද පොළොව මුළුල්ලෙහි යවනු ලැබූ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් සත්දෙනා වන ඇස් සතක් ද ඇත්තා වූ බර්නු ලැබුවාක් වෙන් පෙනුණා වූ බැටළු පැටවෙක් සිංහාසනය සහ ජීවමාන සත්වයන් සතර දෙනා මධ්‍යයෙහිත් වැඩිවහල්ලන් මධ්‍යයෙහිත් සිටිනවා දුටිවි."** (එළිදරව් 5:6) ස්වර්ගීය තේජස මධ්‍යයේ වුවද අපට කුරුසියේ ඇණ ගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේගේ දර්ශනයක් ලැබේ. පාවුල් කුරුසිය හැර අන් කිසිවක් ගැන පාරට්ටු කරගත්තේ නැත. ඔහු හා සමානවීමට උත්සාහ කරන්න. ඔබගේ දෑස් ඉදිරිපිට කුරුසියේ ඇණගසන ලැබුවා වූ යේසුස් වහන්සේ සම්පූර්ණයෙන්ම තබාගන්න. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය මත වාස කිරීම අප සියලුදෙනාට ඉතා අනර්ඝ දෙයක් බව මම විශ්වාස කරමි.

අලුත් ගිවිසුම තුළ හතරවතාවකට වඩා කුරුසපත්වීම ගැන විස්තර කර තිබෙන්නේ නිකම්ම නොවේ. සුභාරංචි පොත් ලියනු ලැබූ කතෘවරු හතරදෙනාම එකලෙස විස්තර කරන දේවල් ඉතා ස්වල්පයකි. පොදුවේ ගත් කළ මතෙව්, මාර්ක්, ලූස්, අපගේ ස්වාමීන් වහන්සේගේ ඉතිහාසය ගැන යමක් පැවසුවහොත් යොහාන් එය කියන්නේ නැත. නමුත් හතර දෙනාම අපට වඩාත් සම්පූර්ණයෙන් ලබාදෙන එක් දෙයක් ඇත. ඒ එක දෙය නම් කුරුසියේ කතාවයි. මෙය කැපී පෙනෙන කාරණාවක් වන අතර එය නොසලකා හැරිය යුතු නොවේ.

මම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය තුළ ප්‍රඥාව, බලය, සාමය, බලාපොරොත්තුව, ප්‍රීතිය, සතුට, සහනය, සැනසීම යන කාරණා සියල්ල දකිමි. මම කුරුසිය පිළිබඳව මගේ කල්පනාවේ තබාගන්නා තරමට එහි සම්පූර්ණත්වය මට වඩා හොඳින් පෙනෙන බව දැකිය හැකිය. මම මගේ සිතුවිලි තුළ කුරුසියේ පූජාව වැඩි කාලයක් පවත්වාගන්නා තරමට ලෝකයේ වෙනත් ඕනෑම තැනකට වඩා කුරුසිය පාමුල ඉගෙන ගැනීමට බොහෝ දේ ඇති බැවින් තෘප්තිමත් වන්නෙමි.

පියාණන් වහන්සේගේ ආදරය

පව්කාර ලෝකය කෙරෙහි පියාණන් වහන්සේ වන දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ දිග, පළල මම දැනගත යුතුද ... ? මට එය වැඩිපුරම ප්‍රදර්ශනය කරන්නේ කෙසේද ... ? ස්තුතිවන්ත නොවන සහ නපුරු අය මත දිනපතා බැබළෙන උනවහන්සේගේ තේජත් හිරුගේ බැබලීම දෙස බලන්නද ... ? නිතිපතා වාර්ෂිකව නැවත පැමිණෙන බීජ කාලය සහ අස්වැන්නේ කාලය දෙස බලන්නද .. ? නැත, මේ ආකාරයේ ඕනෑම දෙයකට වඩා මම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලද්දී උන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳ වඩාත් ශක්තිමත් සාක්ෂියක් මට සොයාගත හැකිය.

මම එහිදී දකින්නේ පියාණන් වහන්සේගේ ආදරයේ හේතුව නොව ආදරයේ බලපෑමයි. දෙවියන් වහන්සේ මේ නපුරු ලෝකයට කොයිතරම් ප්‍රේම කළා ද කියා මම දකින්නේ පියාණන් වහන්සේ තම ඒකජාතක පුත්‍රයාණන් වහන්සේව ලබාදීම තුලිනි. දුක්විඳීමට සහ මරණයට පත්කිරීමට දුන් සේක. උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සැමදෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිස එසේ කළ සේක. (යොහාන් 3:16) පියාණන් වහන්සේ අපට ප්‍රේම කරන බව දනිමු. මක්නිසාද උන්වහන්සේගේ එකම පුත්‍රයාණන්ව රැකපලා ගැනීමට නොහැකි තරම් දෙවියන් වහන්සේ ඉතා උසස් සහ ශුද්ධව සිටින බව සමහර විට සිතිය හැකිය. නමුත් මම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලන විට මට එසේ සිතිය නොහැකිය.

පාපයේ පාපිෂ්ඨබව

දෙවියන් වහන්සේ ඉදිරියේ පාපය කෙයිරතම් අප්‍රසන්න සහ පිළිකුල් දෙයක් ද කියා දැනගන්නේ ද ... ? එයින් මාව පිටපතට ගෙනාවේ කුමකින්දැයි මා දකින්නේ ද ... ? මම ඉතිහාසය දෙසට හැරී නෝවාගේ කාලයේ ජල ගැල්මෙන් පාපිෂ්ඨ ලෝකය ගිලී ගිය ආකාරය කියවන්නද .... ? මම මළ මුහුදේ වෙරළට ගොස් සොදොම සහ ගොමෝරාවේ පාපය කුමක්දැයි සලකුණු කරන්නද ... ? නැත. මට තවමත් පියාණන් වහන්සේගේ ප්‍රේමය පිළිබඳව පැහැදිලි සාක්ෂියක් සොයාගත හැකිය. මම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලමි. එහිදී මම දකින්නේ පාපය කොයිතරම් කළු සහ අප්‍රසන්නද කියාත් දෙවියන් වහන්සේගේම පුත්‍රයාණන් වහන්සේගේ රුධිරය හැර අන් කිසිවකට එය සේදිය නොහැකි බවය. පාපය මාගේ ශුද්ධ වූ මැවුම්කරුවාණන්ගෙන් මාව වෙන් කර ඇති අතර ස්වර්ගයේ සිටින කිසිම දේවදූතයෙකුට පියාණන් වහන්සේ සහ අප අතර සමගිකමක් ඇති කළ නොහැකි වූ බව මම දකිමි. ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට වඩා අඩුවෙන් සිදුවෙන්නාවූ වෙන කිසිවකට අපව සමගි කළ නොහැකි විය. උඩඟු මනුෂ්‍යයන්ගේ කථාවලට මම සවන් දුන්නොත් සමහර විට පාපය එතරම් අප්‍රසන්න දෙයක් නොවන බව සිතෙන්නට පුළුවන. නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලන විට මට පාපය ගැන සුළුවෙන් සිතිය නොහැකිය.

ජේ.සී. රයිලි විසිනි

ගැලවීමේ පූර්ණත්වය

දෙවියන් වහන්සේ පව්කාරයන් සඳහා ලබා දී ඇති ගැලවීමේ පූර්ණත්වය මට දැනගත හැකිද ... ? මම එය වඩාත් පැහැදිලිව දකින්නේ කොතනින්ද ... ? මම දෙවියන් වහන්සේ ගැන බයිබලයේ ප්‍රකාශ කරන දයාවේ පොදු කරණා වෙත යොමුවන්නද ... ? දෙවියන් වහන්සේ ප්‍රේමයේ දෙවියන් වහන්සේ යන සාමාන්‍ය සත්‍යතාවයෙහි මම රැඳිසිටින්නද ... ? නැත. මම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලන්නෙමි. වේදනාකාරී හෘදය සාක්ෂියක් සහ කැළඹිලි සහිත හදවතක් ඇති මා වෙනුවෙන් ශාපතලත් ගසක් මත යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණය විඳීම තරම් අනර්ඝ වූ සුවද තෙලයක් මෙන් වන්නා වූ කිසිම සාකෂියක් මට හමුවූයේ නැත.

මගේ අතිවිශාල ණය සඳහා සම්පූර්ණ ගෙවීමක් එහිදී කර ඇති බව මම දකින්නෙමි. මා විසින් කඩන ලද නියෝගවල ශාපය මා වෙනුවට දුක්වින්ද තැනැත් වහන්සේ උසුලාගත් සේක. මා වෙනුවෙන් ගෙවීමට තිබූ සියළුම ඉල්ලීම් තෘප්තිමත් කර ඇත. තවත් ප්‍රජාවක් අවශ්‍ය නොවේ. මට සමහර වේලාවට සිතෙන් පුළුවන්, මට මගේම සිත කොඳුරන්නට පුළුවන් මට සමාව දෙන්න බැරි තරම් මම

2 පිටුවට

1 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේගේ...

නරකයි කියලා ගලවන්න බැරි තරම් මම දුෂ්ඨයි කියලා. නමුත් මගේ යහපත් අවස්ථාවලදී මෙය මගේ අනුවන කල්පනාවක් බව මම දනිමි. කල්වරිය මත වැගිරුණු ලේ වලින් මගේ සැකයට පිළිතුරු ලැබුණා. මම කුරුසිය දෙස බලන විට ඉතා පහත් මනුෂ්‍යාන්ට වුවත් ස්වර්ගයට යාමට මාර්ගයක් ඇති බව මම විශ්වාස කරමි.

ශුද්ධ ජීවිතයක් සඳහා පෙළඹවීම

මම ශුද්ධ මනුෂ්‍යයෙක්වීට ශක්තිමත් හේතු සොයාගන්නවාද ... ? ඒ වෙනුවෙන් මා හැරිය යුත්තේ කොතැනටද .. ? මම දසපනතට සවන් දෙන්නද .. ? කරුණාවට කළ හැකි දේ ගැන බයිබලයේ දී ඇති උදාහරණ මම අධ්‍යයනය කරන්නද .. ? මම ස්වර්ග යේ විපාකය ගැනත්, අපායේ දඬුවම ගැනත් මෙනෙි කරන්නද .. ? ඊට වඩා ප්‍රබල අදහක් තවම නැද්ද.. ? මම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලන්නෙමි.

ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය මට මා වෙනුවෙන් ජීවත්වීමට නොව උන්වහන්සේ වෙනුවෙන් ජීවත්වීමට මාව පොළඹවන බව මම දකිමි. එහිදී මට පෙනේනේ මම දැන් මාගේ නොවන බවයි. මාව මිලදීගෙන ඇත. යේසුස් වහන්සේ දී ඇති ශරීරයෙන් සහ ආත්මයෙන් උන්වහන්සේව මහිමයට පත් කිරීමට මම බැඳී සිටිමි. යේසුස් වහන්සේ මා වෙනුවෙන් උන්වහන්සේගෙ ම ජීවිතය පූජා කළේ සියලු අයුතුකම්වලින් මාව මුදා ගැනීමට පමණක් නොව, මාව පවිත්‍ර කිරීමටත් යහපත් ක්‍රියාවලට ජ්වලිතව සිටින පිනිස සුවිශේෂ කෙනෙකු බවට පත්කිරීමටත් බව දනිමි. මා පාපයට මැරී ධර්මිෂ්ඨකමට ජීවත්වන පිණිස උන්වහන්සේ ගස මතදී මාගේ පාප උන්වහන්සේගේම ශරීරයෙන් දරාගත් සේක. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය තරම් පැහැදිලි දර්ශනයක් සහිත ශුද්ධ වූ කිසිවක් නැත. එය අපටත්, අප ලෝකයටත් කුරුසියේ ඇණ ගසනු ලබයි. අපගේ පව් නිසා යේසුස් වහන්සේ මරුණු බව මතකයේ තබාගන්නා විට අපි පාපයට ඇළුම්වන්නේ කෙසේද .. ? කුරුසියෙහි ඇණ ගසන ලද ස්වාමීන් වහන්සේගේ ගෝලයන් තරම් කිසිවෙක් ශුද්ධව සිටින්නේ නැත.

සෑහීමට පත්වීමට (තෘප්තිමත්වීමට හේතුව)

ජීවිතයේ අවුල් සහගත තත්ත්වය (කරදර) සහ සියලු කණස්සළුවීම් මධ්‍යයේ ප්‍රීතිමත්ව සහ තෘප්තිමත්ව සිටින්නේ කෙසේදැයි මම ඉගෙන ගන්නෙමි. මම කුමන පාසලකට යා යුතුද ? මම මෙම තෘප්තිමත් මානසික තත්ත්වය වඩා පහසුවේ ලබාගන්නේ කෙසේද .. ? මම දෙවියන් වහන්සේගේ පරමාධිපත්‍යය, දෙවියන් වහන්සේගේ ප්‍රඥාව, දෙවියන් වහන්සේගේ රැකවරණය, දෙවියන් වහන්සේගේ ප්‍රේමය දෙස බලන්නද ... ? එසේ කිරීම යහපත්ය. නමුත් මට තවමත් හොඳ තර්කයක් තිබේ. එනම් මම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලන්නෙමි.

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ඒකජාතක පුතුයාව මුදා නොගෙන මා වෙනුවෙන් උන්වහන්සේව මරණයට භාර දුන් දෙවියන් වහන්සේ පුත්‍රයාණන් ඇතුළු මට අවශ්‍ය අනිත් සියල්ල ලබාදීමට සෑහෙන සේක. මාගේ ආත්මය වෙනුවෙන් එම වේදනාව දරාගත් ක්‍රිස්තුස් වහන්සේ කිසිදු යහපතක් මාගෙන් වළක්වන්නේ නැත. මා වෙනුවෙන් උතුම්ම දේ කළ තැනැත් වහන්සේ ඊට වඩා අඩුව තබෙන දේ නොකර සිටින සේක්ද ... ? මට ස්වර්ගීය වාසස්ථානයක් ලබාදීමට තමන් වහන්සේගේ රුධිරය වැගිරෙවූ උන්වහ්නසේ මේ ලෝකය හරහා යන ගමනේ දී මට ප්‍රයෝජනවත් වන සියල්ල මට සපයනු ඇත. ප්‍රිය සහෝදරය, කුරුසිය පාමුල හා සසදා සෑහීමට පත්වීම සඳහා ඉගෙන ගැනීමට වෙනත් පාසලක් නොමැත.

සෑම කිතුණුවෙක්ම කුරුසියේ තේජස තුළ සිටිය යුතු බව මා පැවසීම ගැන ඔබ පුදුම වෙනවාද ... ? ඕනෑම කෙනෙකුට කුරුසිය ගැන අසා නොසැලී සිටීමට හැකිවීම ගැන ඔබ පුදුම නොවන්නේද ... ?

කුරුසියේ බලය

ඩේවි බට්ස් විසිනි.

මුළු මිනිස් ඉතිහාසය පුරාම සාතන් මනුෂ්‍යයාව පාපයේ සහ මරණයේ වහල්භාවයට පත් කළේය. යමෙක් පව් කළොත් ඔහු මරණයට සුදුස්සෙක් බව දෙවියන් වහන්සේගේ නියමය ප්‍රකාශ කර තිබූ සේක. මනුෂ්‍යයා මරණයට ඇති බිය නිසා සාතන් මනුස්‍යාව තවත් වහල්භාවයට පත් කළේය. මනුෂ්‍යය වර්ගයාගේ දුක්ඛිත තත්ත්වය ඉතා මංමුලා සහගත බවක් පෙනෙන්නට තිබුණි. ක්‍රිස්තුස් වහන්සේ සටනට අවතීර්ණ වූයේ මේ නිසාය. මිනිසාට තමාවම බේරා ගැනීමට නොහැකි විය. පාපය සහ මරණය සියලුම මනුස්‍යයන් කෙරෙහි ආධිපත්‍යය ඇතිව බලපෑවේය. එවිට කුරුසිය පැමිණියේය. එම කුරුසිය මත ක්‍රිස්තුස් වහන්සේ මනුස්‍යය වර්ගයා සඳහා වූ සටන ජයගත් සේක. කෲර ලෙස මරා දමන ලද දෙවියන් වහන්සේගේ අහිංසක බැටළු පැටවාණන් වන්දිය ගෙවූ සේක. උන්වහන්සේ කැමැත්තෙන්ම අපගේ සියලු පාපයන් සහ පාපයේ වන්දිය උන්වහන්සේගේ පිටට ගත්සේක. උන්වහන්සේ අප සෑම කෙනෙකුටම ලැබිය යුත මරණයට මිය ගිය අතර මනුස්‍යා වර්ගයා කෙරෙහි පාපය සහ මරණය අල්ලාගෙන සිටි සියල්ලම එකවර අවසන් කළ සේක. යේසුස් වහන්සේව අනුමනය කරන සියල්ලන්ම පාපයෙන් නිදහස්වී මරණයෙන් ගැලවී දැන් ජීවනය ලබා ඇත. කුරුසිය ජයග්‍රහණයේ මාධ්‍යයක් ලෙස සදාකල්ම පවතියි.

මෙය තේරුම් ගැනීමෙන් සභාවට කුරුසිය ඉතා වැදගත් වන්නේ මන්දැයි දැකීමට අපට උපකාරී වේ. කුරුසිය වචනාර්ථයෙන් අපගේ ඇදිහිල්ලේ වස්තුවක් බවට පත්වේ. **"එකින්සාද කුරුසියේ වචනය විනාශවෙන්නන්ට මෝඩකමය. නමුත් ගැළවෙන්නා වූ අපට ඒක දෙවියන් වහන්සේගේ බලයය."** (1 කොරින්ති 1:18) කුරුසිය දෙවියන් වහන්සේගේ බලයයි. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමට තෝරාගත හැකිව තිබූ සියලුම දේ අතරින් උන්වහන්සේ කුරුසිය තෝරාගත් සේක. කුරුසිය යනු දෙවියන් වහන්සේගේ බලය ප්‍රකාශ කරන ආකාරයයි. පාවුල්තුමා මෙලෙස ලියන්නේ එබැවිනි. **"එසේ වුනේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන් වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය."** (1 කොරින්ති 2:5) 1 කොරින්ති පළමුවන පරිච්ඡේදය තුළ පාවුල්තුමා අපට උගන්වන්නේ කුරසිය දෙවියන් වහන්සේගේ බලය බවයි. එවිට ඔහු අපට පැවසුවේ අපගේ ඇදහිල්ල දෙවියන් වහන්සේගේ කුරුසියේ බලය මත රැඳී තිබෙන බවයි. අද දවසේ අපගේ ඇදහිල්ලේ අත්තිවාරම (පදනම) කොහෙද ... ?

අපෝස්තුළුතුමා මේ දේවල් ප්‍රකාශ කළේ බයෙන් සහ වෙව්ලමින් දේශනා කරමින් බවත්. ඔහුගේ පණිවිඩය ප්‍රඥාවෙන් ඒත්තු ගැන්වෙන වචන වලින් නොවූ බවත්, ඔහුගේ දේශනාව ඒ පසුබිමට අනුකූලව තිබූ බවත් පවසමිනි. සේ වූයේ කොරින්තිවරුන්ගේ ඇදහිල්ලේ පදනම වන්නේ අපෝස්තුළුවරයා හෝ වෙනත් මනුස්‍යයෙකු නොව නමුත් කුරුසිය හරහා දෙවියන් වහන්සේගේ බලය මත බවයි. මාගේ මිත්‍රවරුණි. වර්තමානයේ සභාව මේ වචනවලට පිටස්තරයෙන් ජීවත් වෙමින් බලාපොරොත්තු රහිත තත්ත්වයට පත්වී ඇත. අද බොහෝ දෙනෙක් ක්‍රියා කරන්නේ අපගේ ඇදහිල්ල කුරුසිය මත නොව මනුස්‍යයා මත පදනම් වී තිබෙන්නාක් ලෙසය. අපි අපේ දේවගැතිවරයාට කැමති නම්,අ පි අපගේ දේවස්ථානයට කැමැත්තෙමු. අපේ පාලකතුමා අපි අකමැති අයගේ ලැයිස්තුවේ සිටිනවා නම් අපි දේවස්ථානයට කැමති නැත. මෙය එසේ වූ විට අපගේ ඇදහිල්ල කොහිද ..? එය කුරුසියට වඩා මිනිසුන් තුළ මුල් බැසගෙන ඇත.

පණිවිඩය සහ අදහස්

අපගේ ඇදහිල්ලට පමණක් නොව අපගේ පණිවිඩයද කුරුසිය මත බව සභාව අවබෝධ කරගත යුතුය. කුරුසියේ පණිවිඩය අමතක කරන සභාවට එය ඉතා අනතුරු සහිතය. අතරමංවී මිය යන ලෝකයට දිය යුතු පණිවිඩය මෙයයි. අපගේ ලෝකයට වෙනත් විසඳුමක් නැත. විකල්ප සැලැස්මක් නැත. දෙවියන් වහන්සේගේ බලය මේ ලෝකයට පෙන්නුම් කර ඇත්තේ කුරුසිය හරහාය. ලෝකය ඇති කරන වරද කුමක් වුවත් සභාව කුරුසියේ පනිවිඩය අපගේ ලෝකය වෙත ගෙන යා යුතුය.

සභාවේ සිට පුද්ගලික කිතුණුවෙක් වෙත ගමන් කරමින් කුරුසිය පිළිබඳ අපගේ අවබෝධය තවත් එක් පියවරක් ඉදිරියට යමු. කුරුසිය අපගේ ගැලවීමේ අදහස (මාධ්‍යය) බව පුද්ගලිකව අවබෝධ කරගත යුතුය. පළවෙනි කොරින්ති පොතේ කුරුසියේ පණිවිඩය ගැන කථා කරමින් පාවුල්තුමා මෙසේ ලියා ඇත. **"මක්නිසාද දෙවියන් වහන්සේගේ ප්‍රඥාවේ හැටියට ලෝකයා ස්වකීය ප්‍රඥාවෙන් දෙවියන් වහන්සේව ඇදින නොගතග් බැවින් දේශනා කිරීමේ මෝඩකම කරුණුකොටගෙන අදහන්නන් ගලවන්නට දෙවියන් වහන්සේ සතුටු වූ සේක."** (1 කොරින්ති 1:21) කුරුසියේ පණිවිඩය විශ්වාස කරන අයට සදාකාල ජීවනය ලැබේ. මක්නිසාද කුරුසිය මත අපගේ පාපය මිය ගියේය. ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔවුන් කුරුස පත් විය. පාපය සහ මරණය තවත් අපව පාලනය නොකරයි. කුරුසිය නිසා අපි ජීවත්වන්නෙමු. කුරුසිය අපගේ ගැලවීමේ එකම මාර්ගයයි. අද බොහෝ අය වෙනත් මාර්ග සොයා ගැනීමට උත්සාහ කරති. එය අණුවන ක්‍රියාවක් බව පෙනේ. කුරුසිය තුළින් අපව බෝරාගන්නා අතර බයිබලය වෙනත් මාර්ගයක් පෙන්වා දෙන්නේ නැත.

ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණ ගසනු ලැබ සිටිමි.

කිතුණුවා කුරුසියට ආදරය කළ යුතු අතර එය තමාගේ ලෙස පිළිගත යුතුය. යේසුස් වහන්සේගේ කුරුසිය අපගේ කුරුසිය බවට පත්විය යුතුය. යේසුස් වහන්සේ මෙලෙස පැවසූ සේක. **"එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථාකොට යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාව නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා "** (මතෙව් 16:24) සෑම කිතුණුවෙකුටම කුරුසියක් ඇත. අප සියලුදෙනාම මෙම කුරුසිය දරා සිටින අතර එය කුරුසියේ ඇණ

3 පිටුවට

"යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේම ආශා වළකාගෙන දවස්පතා තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා." (ලුක් 9:23)

2 පිටුවෙන්

කුරුසියේ බලය...

ගසන ලද ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියයි. පාවුල්තුමා මෙසේ ලියා අත. ***"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. එසේවී නමුත් මම ජීවත්වෙමි. නමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංසයෙහ ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළා වූ, මා උදෙසා තමන්ම පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි."*** (ගලාති 2:20) සහාව යනු කුරුසියේ ඇණ ගසනු ලැබූ මනුෂ්‍යයන්ගේ රැස්වීමකි. අපි ක්‍රිස්තුස් වහ්නසේ සමග කුරුසියේ ඇණ ගසනු ලැබුවේ කෙසේදැයි අපට නොතේරෙන්නේ නම් ජයග්‍රාහි කිතුණු ජීවිතයට යතුර අපට මගහැරේ.

පාවුල්තුමා මෙය පැහැදිලි කරන ආකාරය දෙස බලන්න. ***"නොහොත් ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළට බෞතිස්ම ලැබුවා වූ අප සියල්ලන් උන්වහ්නසේගේ මරණයට බෞතිස්ම ලැබූ බව නුඹලා නොදැන සිටින්නහුද .. ? එබැවින් ක්‍රිස්තුස් වහන්සේ පියාණන් වහන්සේගේ මහිමය කරුණාකොටගෙන මළවුන්ගෙන් නැඟිටුවනු ලැබුවාසේම අපිත් ජීවිතයේ අළුත්කමින් හැසිරෙන පිණිස මරණය තුළට බෞතිස්මය කරුණාකොටගෙන උන්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවෙවුව. මක්නිසාද උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන්වහන්සේට සම්බන්ධවී සිටිමු නම් උන්වහන්සේගේ නැඟිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධවන්නෙමු. මින්මතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ඩරීරය නැති වන පිනිස අපේ පරණ මනුෂ්‍යයා උන්වහ්නසේ සමඟ කුරුසියෙහි ඇණ ගසන ලද බව දනිමුව. මක්නිසාද මැරුණා වූ තැනැත්තේ පාපය ගැන නිර්දෝෂ කරනු ලැබ සිටියි. තවද මළවුන්ගෙන් නැඟිටවනු ලැබුවාවූ ක්‍රිස්තුස් වහන්සේ තවත් නොමැරෙන බවත් මරණය උන්වහන්සේ කෙරෙහි තවත් බලය නොපවත්වන බවත් අපි දන්නා බැවින්, අපි උන්වහන්සේ සමඟ මැරෙමු නම් උන්වහන්සේ සමඟ ජීවත්වන්නෙමු යයි විශ්වාස කරමුව, මක්නිසාද උන්වහන්සේ මැරුණු මරණයෙන් එකවරක් පාපපයට මළ සේක. නමුත් ජීවත්ව ජීවිතයෙන් දෙවියන් වහන්සේට ජීවත්වන සේක. එලෙසම නුඹාත් පාපයට මැරී සිටිනන්නන් කොටද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතාගනිල්ලා."*** (රෝම 6:3-11)

මගේ මිත්‍රවරුණි, අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ මැරුණෙමු නම්, අපි එසේ නොකළාසේ ක්‍රියාකාරන්නේ ඇයි ... ? අපි මේ ජීවිතයට මෙතරම් තදින් ඇලී සිටින්නේ ඇයි ... ? මේ ලෝකයට අයිති නැති අපි මේ ලෝකය සහ මේ ලෝකයේ දේවල් ගැන සැලකිලිමත් වන්නෙමු. අපගේ පුරවැසිභාවය තිබෙන්නේ ස්වර්ගයෙහිය. ශාරීරක මරණයට අපගේ ජීවිතය අවසන් කළ නොහැකිය. අප දැනටමත් මරණයට පත්වී ඇත්නම් අපට මරණය යනු කුමක්ද .. ? අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවමානව සිටින විට අපි සදාකාලිකවම ජීවත්වන්නෙමු. එය කොයිතරම් තේජාන්විත ජීවිතයක්ද ... ? අපි අපේ බලයේ නොව කුරුසියේ බලයෙන් ඉදිරියට දුවන්නෙමු. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසය අපගේ කුරුසිය බවට පත්වේ.

කිතුණුවා ලෝකයට සාක්ෂිකාරයෙකි

(ඒ.ඩබ්. ටෝසර් විසිනි.) (1897 - 1963)

භාවේ නිල මෙහෙවර ප්‍රකාශ කිරීම වන්නේ සාක්ෂි දැරීමසහ අණාවරණය කිරීමයි. දෙවියන් වහන්සේගෙන් ලද සදාකාලික මහා සත්‍යයන් පිළිබඳව සාක්ෂිකාරයෙක්වීමට ඇයව මේ පොළොවේ තබා ඇත. ඇය එය පැවසුවොත් මස ලෝකයට එය දැනගත නොහැකිය. යේසුස් වහන්සේ මුල් ගෝලයන්ට මෙසේ පැවසූ සේක. ***"එබැවින් නුඹලා ගොස් සියළු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයට බවුන් බෞතිස්ම කරපල්ලා."*** (මතෙව් 28:19) සභාවට ඉගැන්වීමටත්, ලෝකයට සවන්දීමටත් සිදු වූ අතර, සභාවේ සාක්සිය ලැබූ සියල්ලන්ම බෞතිස්මවී දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ අභිරහස් තුළ තවදුරටත් ඉගැන්විය යුතුය. එය නැවත නැගිටුණාවූ ක්‍රිස්තුස් වහන්සේ විසින් පිහිටවනු ලැබූ පිළිවෙලයි. පළමු කිතුණුවන් මුලින්ම එවැනි පුදුම වූ ආශ්දර්යයන් දැක අසා ඇති අතර පසුව ඔවුන්ව උසස් වූ ප්‍රීතියකින් පුරවා ඇත. ඔවුන් තම ස්වාමියා සොහොන විවර කරගෙන මළුවන්ගෙන් නැගිටි ප්‍රවෘත්තිය ප්‍රචාර කිරීමට දිව ගියෝය.

දින කිහිපයකට පසුව ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් වෙත පැමිණියේ සත්‍යතාවය තහවුරු කිරීමට සහ ඔවුන්ගේ සාක්ෂියට නව සදාචාරාත්මක බලයක් එක් කිරීමටයි. ඒ සියල්ල ආරම්භ වූයේ එලෙසිනි. මුල් සභාවට පණිවිඩය තිබූ අතර ලෝකයට තිබුණේ එම පනිවිඩයේ අවශ්‍යතාවය පමණි. ගෝලයන් පියාණන් වහන්සේ සමඟ සිටිමින් උන්වහන්සේ මනුෂ්‍යයන්ට ප්‍රකාශ කළ එම සදාකාල ජීවනය දැක, ස්පරශ කර සහ එය හසුරුවා ඇත. ප්‍රතික්ෂේප කළ නොහැකි බලයකින් ඔවුන් යුදෙව්වන්, ග්‍රීකයන්, වහලුන්, නිදහස්ව සිටින මනුෂ්‍යයන්, උසස් අය, පහත අය යන සියල්ලන්ම සාක්ෂිදීමට ප්‍රකාශ කිරීමට, තහවුරු කිරීමට, පිටත්ව ගියෝය. කිතුණුවන්ගේ ඊළඟ පරම්පරාව ක්‍රීස්තුස් වහන්වේ ඔවුන්ගේ ස්වාභාවික ඇස්වලින් දැක නොතිබුණත්, ජීවමනාව උන්වහන්සේව මුණ ගැසී සහ ශුද්ධාත්මයාණන් වහ්සේගේ ඇතුළාන්ත ක්‍රීයාකාරීත්මයෙන් උන්වහන්සේව හඳුනාගෙන, අත්දැක මුල් ගෝලයන් තුළ තිබූ ජ්වලිතයේම පණිවිඩය ප්‍රකාශ කළෝය. ඔවුන්ට ලෝකයට කියන්නට දෙයක් තිබුණි. ඔවුන් උද්යෝගයෙන් සාක්ෂිදුන් සාක්ෂිකරුවන් විය. ඔවුන් බැතිමතුන්, ජ්වලතව සිටි අය වූ බැවින් ලෝකයට අතිශයින් අවශ්‍ය වූ සහ නොසලකා හැරීමට නොහැකි සත්‍යතාවය ඔවුන් සතුව තිබෙන බව ඒත්තු ගැන්වූහ.

සභාවේ ඇසීම සහ දැකීම ඇති සෑම තැනකම එය එසේ විය. රන් පහන් රුක් සක මැදින් කෙනෙක් ඇවිද යමින් බොහෝ ජල දාරාවන් මෙන් හඬ ඇසෙන විට ඒ හඬ දෝංකාරදීමට සභාව සිටගෙන සිටින අතර ලේකයට එය ඇහුමකන්දීමට සිදුවේ. සමහර අවස්ථාවලදී ලොක්යා ඔවුන්ට පිටුපා මරණය දක්වාම ඔවුන්ට හිංසා කළෝය. සමහරවිට පොරෝද්, යොහාන් බෞතිස්තට ඇහුම්කන් දුන්නාක් මෙන් ඇහුම්කන් දුන්නෝය. ඇසූ දෙයින් ගැඹුරින්ම ස්පර්ශ කළ නුමත් කීකරුවීමට අකමැති විය. සමහර විට එයට සානුකම්පිතව ඇහුම්කන් දුන් අතර බොහෝ මනුෂ්‍යයෝ පසුතැවිලි වී ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කළෝය. නමුත් සෑමවිටම ලෝකය පිළිගැනීමේ කෙළවර මත සිටියෝය. සභාව කථා කළ අතර ලේකයට ඇසුණි. ක්‍රිස්තුස් වහන්සේ පැවසූ පරිදි එය එසේ විය යුතුය.

නැති වූ අහිමි වූ සාක්ෂිය

නමුත් අහස්තලය ආසන්න පොළොව විශ්මයට පත්වෙන්න. මක්නිසාද සභාවේ සහ ලෝකයේ තිබිය යුතු තත්ත්වයේ විකෘතිවීමක් සිදු වී ඇත. මීට වසර කිහිපයකට පෙර බලාපොරොත්තු නොවූ පරිදි විශ්වාස කළ නොහැකි තරම් අන්තග ාමී වෙනස් පරිවර්තනයක් සිදුවී ඇත. සභාවට ඇගේ සාක්ෂිය අහිමිවී ඇත. ඇයට තවදුරටත් ලෝකයට කියන්නට දෙයක් නැත. වරක් ඇගේ ශක්තිමත් මොරගැසීම, සමාව අයැදීමේ හඬ ක්‍රමක්‍රමයෙන් මැකීගොස් වරක් සාක්ෂි දැරීමට පිටත්ව ගිය ඇය දැන් සෝදිසි කිරීමට පිටත්ව යති. ඇගේ ආකල්පමය ප්‍රකාශය ගෞරවණීය යෝජනාවක්, ආගමික උපදෙස් සහිත වචනයක් බවට පත්වී ඇත. සියල්ලට පසු එය මතයක් පමණ් වී උද්යෝගයෙන් ප්‍රකාශ කිරීම අදහස් නොකරයි.

සභාවට ලෝකයට කීමට කිසිවක් නැතුවා පමණක් නොව, ඇත්ත වශයෙන්ම දේවසේවකයන් දැන් ආලෝකය සඳහා ලෝකයට යති. ඔවුන් උපදෙස් දහා ආදයම්ගේ පාමලු හිඳ තමන්ගේ පණිවිඩය ඉදිරිපත් කිරීමට නිර්භීතවීමට පෙර ප්‍රඥාවන්ත සහ විචක්ෂණශීලී (සිහිබුද්ධියෙන් කටයුතු කරන) අය සමඟ ඔවුන්ගේ පණිවිඩය පැහැදිලි කරති. නමුත් දැකීමෙන් ලැබෙන නිසැකකම සහ ඇසීමෙන් ඇතිවන සහතිකය පිළිබඳව ඔවුන් කොහේද ... ?

දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා

නමුත් සභාව කැඳවා ඇත්තේ කුමක් ප්‍රකාශ කිරීමට ද... ? ලෝකයට දීමට ඇයව එවා ඇති දුෂ්කර, නිර්භීත, සදාකාලික වචන මොනවාද ..? පළමුවැන්න නම්, දෙවියන් වහන්සේ සියල්ල තුළ සිටින බවයි. අනිත් සියලුදෙනාට මඟපෙන්වන්නා වූ මහත් වූ මඟපෙන්වනතා උන්වහ්නසේය. ***" වම ඒ තැනැන්වහන්සේ බව නුඹලා දැනගන මා විශ්වාස කර තේරුවී ගන්න පිණිස, නුඹලා මාගේ සාක්ෂිකාරයෝව මා විසින් තෝරාගත් මාගේ මෙහෙකරුවාව සිටින්නහුයයි ස්වාමීන් වහන්සේ කියන සේක. මා සිටින්ට පළමුවේ කිසි දෙවේ කෙනෙක් සාදනු ලැබුවේ නැත. මට පසුව සිටින්නෙත් නැත." (යෙසායා 43:10) එසේය දවස ඇති වූ තැන් පටන් වම උන්වහන්සේය. මාගේ අතින් මුදන්ට පොහොසත් වූ කිසිවෙක් නැත. වම ක්‍රියාකාරන්නෙමි. වළක්වන්නේ කවුද ... ? "*** (යොසායා 43:13)

මීළඟ ශ්‍රේෂ්ඨ කාරණය නම්, අප සැදී ඇත්තේ දෙවියන් වහන්සේ කරුණුකොටගෙන සහ උන්වහන්සේ උදෙසාවීමයි. මම ආවේ කොහෙන්ද යන ප්‍රශ්නයට පිළිතුර නම්, දෙවියන් වහන්සේ ඔබට මැව්වා යනු මව කරුණුකොගෙන පැමිණියා යැයි කියනවාට වඩා හොඳ පිළිතුරයි. ලෝකයේ පොදු පරිහරණය තුළ මෙම සරල පිළිතුර ප්‍රමාණවත් නොවේ. විදයාත්මක පර්යේෂණ මගින් පදාර්ථ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ රහස් ගැඹුරින් විමර්ශනය කර ඇත. නමුත් පදාර්ථයේ ආරම්භය පිළිබඳව නිශ්ශබ්දව සිටින අතර කිසිදු ප්‍රශ්නයකට පිළිතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරයි. දෙවියන් වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක. පොළොව මත මනුෂ්‍යයා සෑදූ සේක. උන්වහන්සේ උදෙසා මිනිසා මැවූ සේක. දෙවියන් වහන්සේ මාව සෑදුවේ ඇයි ..? යන ප්‍රශ්නයට වෙනත් පිළිතුරක් නොමැත.

කිතුණුවාව වාද කිරීමට 4 පිටුවට
හෝ ඒත්තු ගැන්වීමට යවා නැත.

"අප ප්‍රේමය දැනගෙන සිටින්නේ ඒ තැනැන්වහන්සේ තමන් ප්‍රාණය අප උදෙසා දුන් හෙයිනි්ය. " (1 යොහාන් 3:16)

3 පිටුවෙන්

කිතුණුවා ලෝකයට...

ඔප්පු කිරීමට හෝ තහවුරු කිරීමට යවනු නොලැබේ. ඔහුව යවනු ලබන්නේ ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක කියා ප්‍රකාශ කිරීමටය. ඔහු මෙය කළ පසු ප්‍රතිඵලය සඳහා දෙවියන් වහන්සේට වගකිව යුතු.

එයින් ඔබ්බට යාමට කිසිවෙකුට නුපුළුවන. දෙවියන් වහන්සේ අපව සෑදුවේ උන්වහන්සේ උදෙසාය. මනුෂ්‍යය පැවැත්ම ගැන පැවසිය හැකි පළමු සහ අවසාන දෙය එය වන අතර අපි තව කුමක් එකතු කළත් එය ඊට අදාළ විය යුතුය. දෙවියන් වහන්සේ කවුද සහ අපි කවුරුන්ද යන්න දැකීමට දෙවියන් වහන්සේ සහ අප අතර නිවැරදි සම්බන්ධතාවයක් ඉතා වැදගත් වේ. දෙවියන් වහන්සේ අප තුළ මහිමයට පත්විය යුතු බව මිනිස් හදවතකට පිළිගත හැකි වෙනත් ඕනෑම දෙයකට වඩා සදාචාරාත්මක අවශ්‍යතාවයකි. දෙවියන් වහන්සේ තමන් ගැන සදාකාලිකව සතුටුවන ස්ථානයකට තමන්ව ගෙන ඒම සෑම පුද්ගලයෙකුගේම පළමු වගකිව යුතු ක්‍රියාව විය යුතුය.

යේසුස් වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම.

අපගේ පාපය සහ සදාචාරාත්මක නොදැනුවත්කම අවබෝධකර ගැනීමෙන් එවැනි ප්‍රීතිත් සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමේ නොහැකියාව ක්ෂණිකව පැහැදිලි වේ. අපට දෙවියන් වහන්සේ වෙතට යා නොහැකි බැවින් අපි කුමක් කරමුද ..? කිතුණුවාගේ සාක්ෂිය තුළ පිළිතුර දකින්නට ලැබේ. දෙවියන් වහන්සේ මාංශවත්වී අප අතරට පැමිණි සේක. යෙසුස් වහන්සේ කියා කියන්නේ කවුද ? කියා ලෝකය අසනු ලබයි. යේසුස් වහන්සේ අප වෙත පැමිණියා වූ දෙවියන් වහන්සේය කියා සභාව පිළිතුරු දෙයි. උන්වහන්සේ අපව සෙයා පැමිණ ඇත්තේ අපව දිනා ගැනීමට, අපව නැවත දෙවින් වහන්සේගේ ජයග්‍රහණයට පමුණුවන පිණිස වන සේක. මෙය ඉටු කිරීමට උන්වහන්සේ අප වෙනුවෙන් මිදීමේ මිලය ලෙස මරණයට පත්වීම අවශ්‍ය විය. උන්වහන්සේ අප තුළ මුල් බැස ඇති පාපයේ බලය බිඳ දමා, අප කළ පාප පිළිබඳ වාර්තාව අහෝසිකර, අපගේ පාපයෙන් අපව ඉවත්කර ගත් සේක. මේ සියල්ල කිතුණුවන් පවසන්නේ උන්වහන්සේ කුරුසිය මත පරිපූර්ණව, ප්‍රායෝගිකව , යහපත උදෙසා මැරුණු බවයි.

යේසුස් වහන්සේ දැන් කොහේද .... ? ලෝකයෙන් අසයි. දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ යනුවෙන් කිතුනුවන් පිළිතුරු දෙයි. උන්වහන්සේ මැරුණ නමුත් උන්වහන්සේ මළවුන් අතර නැත. උන්වහන්සේ පැවසූ පරිදි මළවුන්ගෙන් නැගිටුණු අතර ඇසින් දුටු විශ්වාස සාක්ෂිකාරයන් බොහෝමයක් උන්වහන්සේ මරණින් නැවත නැගිටීමෙන් පසුව උන්වහන්සේව දුටුවෝය. සියල්ලටම වඩා හොඳින් උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ දැන් කිතුනුවාගේ හදවතට අනාවරණය කරන්නේ ක්‍රීස්තුස් වහන්සේ මැරුණු කෙනෙකු ලෙස නොව ජීවමානව සිටින කෙනෙකු ලෙයසි. අපව යවනු ලබන්නේ සැක කළ නොහැකි ලෙස එහි සිටි සහ අත්දැක්කා වූ අයගේ සියලු නිර්භීතකම් උද්යෝගයෙන් යුතුව ප්‍රකාශ කිරීමටය.

සුභාරංචිය යනු ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් මැරී නැවත නැගිටවනු ලැබූ බවට නිල ප්‍රකාශය වන අතර විශ්වාස කරන සෑම කෙනෙකුම එම විශ්වාසයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තුස් වහන්සේ සමග පූර්ණ ලෙස සිටීමට සහ අවසානයේ දී සදාකාලික ගැලවීම හිමිකර ගැනීම සිදුවන්නේය. තමා ජනප්‍රිය නොවන බවත්, ලෝකයා ඉදිරියේ යේසුස් වහන්සේ සිටි තැන සිට ගැනීමට තමාව කැඳවා ඇති බවත්, බොහෝ දෙකුගේ ප්‍රසාදයට ලක්වීම සඳහා කිහිපදෙනෙකුගේ ආදරයට ලක්වීමට සහ අවසානයේ බහුතරයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ලක්වන බවත් අවබෝධ කරගත යුතුය. කිතුණුවා මෙම මිලය ගෙවීමට කැමතිවිය යුතුය. එසේ නැති නම් ඔහුට තමාගේම මාර්ගයේ යන්නට ඉඩ හරින්න. දැන් ක්‍රිස්තුස් වහන්සේට ඔහුට කීමට කිසිවක් නැත.

පාපය, ධර්මිෂ්ඨකම සහ විනිශ්චය

කිතුණුවෙකුගේ පණිවිඩය තුලින් ලෝකයාට පාපය, ධර්මිෂ්ඨකම සහ විනිහ්ඡය හඟවා දිය යුුය. ඔහු ලෝකයේ සදාචාර උපදෙස් මාලාවන් අනුව ගමන් නොකළ යුතුය. නමුත් ඒවාට විරුද්ධ විය යුතු ස්ථානවලදී නිර්භීතව නැගී සිට ඒවා අනුගමනය කිරීමේ ප්‍රතිවිපාක ගැන අනතුරු ඇගවිය යුතුය. ඔහු මෙය ස්ථිරව සහ නොපසුබටම කළ යුතු අතරම තමාගේ සාක්සිය පළුදු නොවීමට තමාගේ ජීවිතයේ කාරණා ගැන සුපරීක්ෂාකාරීවීමට දැඩි සැලකිල්ලක් දැක්විය යුතුය.

තවත් එක් දෙයක් තිබේ. දෙවියන් වහන්සේව සුළුකොට නොසිතීම සහ උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ වූ පැවැත්ම සුළුකොට නොසිතන විශ්වාසවන්ත මනුෂ්‍යයෙකුවීමත් කිතුණු සාක්ෂිය තුළ ඇතුළත්ව තිබේ. ඔහු බොහෝ ඉවසිලිවන්තව සහ දයාව දැකීමට ඉවසීමෙන් බලා සිටියි. නමුත් වෙනස් නොවන්නා වූ ආකාරයෙන් පාපය තුළ ජීවත්වන අයට මිත්‍රශීලීව ඒත්තු ගන්වමින් සුභාරංචිය වෙතට ආරාධනා කිරීම නතර කරයි. මරණ පාපයට අළුම්ව සිටින මනුෂ්‍යයාගේ ස්තීර තත්ත්වයයි. යේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කළ ස්ථානය වන නිරයට ඔහුව යවනු ලබයි. එහිදී ඔහු ගැන තවත් බලාපොරොත්තුවක් නැත. අප නිරය ගැන දන්නේ ස්වල්පයක්වීමට පුළුවන. නමුත් නිරය ගැන අපි දන්නා දේ ප්‍රමාණවත් තරම් භයානකය.

විශ්වාසවන්ත සාක්ෂිකරුවන්

දෙවියන් වහන්සේට උන්වහන්සේගෙ ම දරුවන්ට කීමට තවත් බොහෝ දේ තිබෙන සේක. ඒ සියල්ලට සවන්දීමට ජීවිත කාලය පුරාවටම උනන්දුවෙන් ඇහුම්කන් දිය යුතුය. නමුත් උන්වහන්සේ ලෝකයට දෙන පණිවිඩය සරල හා කෙටිය. එය අසන්නන් විසින් පිළිගනු ලබන හෝ ප්‍රතික්ෂේප කරන තුරු සෑම පරම්පරාවකටම නැවත නැවත ප්‍රකාශ කිරීම සභාවේ කාර්යයකි. කිතුණුවා වර්තමාන ආගමික මුලාවීම්වලට හසුනොවීමට වගබලා ගත යුතු අතර සියල්ලටම වඩා ඔහු කිසි විටෙකත් තම පණිවිඩයදීමට යද්දී ලෝකයට හසු නොවිය යුතු-ය. ඔහු පොළොවේ සාක්ෂි දැරීමට පැමිණි ස්වර්ගයට අයිති මනුෂ්‍යයෙකි. ඔහු තමන්ව මිලදීගත් ස්වාමීන් වහන්සේට ගණන් දිය යුතු බැවින් තමාගේ වගකීම ගැන වගබලා ගත යුතුය.

කුරුසිය දරාගැනීම

(ආතර් ඩබ්. පින්ක් විසිනි.) (1886 - 1952)

"එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කතාකොට යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලා තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා." (මතෙව් 16:24)

මෙම පදයේ සඳහන් "කැමති නම්" යන්නෙහි අදහස "ආශාව යන්නයි" එය ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ සියල්ලේ දී භක්තිවන්ත ලෙස ජීවත්වමට ආශාවීම වන්නේය. **"එසේය, ක්‍රිස්තුස් යේසුස් වහ්නසේ තුළ භක්තිවන්ත ලෙස ජීවත්වන්ට කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය. "** (2 තිමෝති 3:12) එයින් "නිශ්චිත වශයෙන්ම" යන්න හගවා දෙනු ලබයි. **"මා ළඟට එන තැනැත්තේ තමාගේ පියාටත්, මවිටත්, භාර්යාවටත්, දරුවන්ටත්, සහෝදරයන්ටත්, සහෝදරියන්ටත්, එසේය. තමාගේම ජීවිතයටත් ද්වේෂ නොකරන්නේ නම් ඔහුට මාගේ ගෝලයා වෙන්ට බැරිය. තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය."** (ලුක් 14:26-27) (මෙහි සඳහන් වන්නේ " කුරුසියක් නොව" "තමාගේ කුරුසියයි.") එබැවින් එය විකල්පයක් නොවේ. කිතුණු ජීවිතය යනු සත්‍ය ක්‍රමයකට දායකවීම හෝ ආචාර ධර්ම පද්ධතියකට අනුගතවීම හෝ ආගික ආඥාවලට යටත්වීමට වඩා බොහෝ සෙයින් වැඩි දෙයකි. ප්‍රධාන වශයෙන් කිතුණුවා යනු පුද්ගලයෙකි. ස්වාමී වූ යේසුස් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවයේ අත්දැකීමත්, ඔබේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඇති සහයෝගීතාවයේ ප්‍රමාණයටත් පමණක් ඔබගේ කිතුණු ජීවිතය ගතකරනවා ඇත.

කිතුන ජීවිතය යනු යේසුස් වහන්සේව අනුගමනය කිරීමෙන් සමන්විත ජීවිතයකි. **"යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාම නොසලකා තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා."** ක්‍රිස්තුස් වහන්සේ සමඟ ගමන් කිරීම සඳහා සමීපවීමට ප්‍රයෝජනවත් වන පිණිස අපව වෙන්කොට හඳුනාගනු ලබන සේක. එවිට අපි සැබවින්ම සමීප හවුල්කරුවන් වනු ඇත. ඔවුන් ගැන ශුද්ධ ලියවිල්ලේ මෙසේ විස්තර කර ඇත. **"ස්ත්‍රීන්ගෙන් කිලුටු නොවූවෝ මොවුහුය. එක්නිසාද මොවුහු බ්‍රහ්මචාරීහුය. බැටළු පැටවාණන් යන යන තැනට උන්වහන්සේ අනුව යන්නෝ මොවුහුය. මොවුහු**

"අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත්වෙන පිණිස උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලූ සේක." (1 පේතුරස් 2:24)

දෙවියන් වහන්සේටත් බැටළුපැටවාණන්ටත් නාඹුල් වල වන පිනිස මනුෂ්‍යයන් අතරෙන් විලේට ගන්නා ලද්දෝය. "(එළිදරව් 14:4) ස්වාමීන් වහන්සේව සම්පූර්ණයෙන් අනුගමනය කළා වූ කාලෙබ් මෙන් ඔවුන් තුන් ගුණයක් සතුටු වනු ඇත. නමුත් තවත් කණ්ඩායමක් ගැන කණගාටුදායක ලෙස පැවසීමට ඇත. ඔවුන් අතරින් විශාල ප්‍රමානයක් ස්වාමීන් වහන්සේව විටින් විට අඩසිතින්, දුරස්ථව අනුගමනය කරන බව පෙනේ. ඔවුන්ගේ ජීවිතවල ලෝකයේ බොහෝ දේ සහ තමන්ගේම කාරණා පවතින බැවින් ක්‍රිස්තුස් වහන්සේට තිබෙන ඉඩ ප්‍රමාණය ස්වල්පව තිබේ.

ප්‍රිය සහෝදරයෙනි, දැන් අපගේ ප්‍රධාන කාර්යය සහ අරමුණ ක්‍රිස්තුස් වහන්සේව අනුග මනය කිරීමයි. නමුත් එම ගමන් මාර්ගයේ දුෂ්කරතා තිබේ. අප අධ්‍යයනය කරන ප්‍රධාන බයිබල් පාඨයේ පළමු

5 පිටුවට

4 පිටුවෙන්

කුරුසිය දරාගැනීම...

කොටස සඳහන් කරන්නේ ඒ සඳහායය. "මාව අනුග මනය කරන්න." යන වචන අවසානයට පැමිණේ අපි යේසුස් වහන්සේ ගමන් කළ මාර්ගයෙහි සිටින අතර දස දහසක් ආකර්ෂණය සහ අවධානය වෙනතකට යොමු කරන ලෝකය ඊට බාධාවකි. එම නිසා අපි අධ්‍යන කරන බයිබල් පදයේ ක්‍රිස්තුස් වහ්නසේ පවසන්නේ යමෙක් මා පසුපස එන්නේ නම් පළමුව ඔහු තමාව ප්‍රතික්ෂේප කර දෙවනුව තමාගේම කුරුසිය රැගෙන තුන්වෙනුව මා අනුව ඒවා. කිතුණුවන් යැයි කියාගන්නා වූ අයගෙන් සුලු පිරිසක් පමණක් උන්වහන්සේව අනුගමනය කිරීමට හේතුව එහිදී අපි ඉගෙන ගනිමු.

තමාවම ප්‍රතික්ෂේප කරන්න.

දෛනිකව ක්‍රිස්තුස් වහන්සේගේ අනුග ාමිකත්වය කරා යන පළමුවන පියවර තමාව ප්‍රතික්ෂේප කිරීමයි. සහෝදරයෙනි, සැබෑ ලෙස තමාවම ප්‍රතික්ෂේප කිරීම පමණක් සිදුකරනු ලැබීම අතර විශාල වෙනසක් ඇත. ලෝකයේ මෙන්ම කිතුණුවන් අතරද ඇති ජනප්‍රිය අදහස නම් අපි කැමති දේ අත්හැරීමයි. අත්හැරිය යුතු දේ ගැන විශාල විවිධත්වයක් තිබේ. රංග ශාලාවට යාම, නැටුම්, තුරඟ තරඟ පිටියට යාම, වැනි ලෞකික ලක්ෂණවලට එය සීමාකරන සමහරු සිටිති. තවත් සමහර අය අවුරුද්දේ ගතකරන විනෝදාස්වාදයන් යම් කාලයන් සහ වෙනත් දේවල් දැඩි ලෙස මගහරිනු ලබති.

නමුත් එවැනි ක්‍රියාවන් අධයාත්මික අභිමානය පමණක් පෝෂණය කරයි. මම බොහෝ දේවල් අත්හැරියොත් නිසැකවම මට ගෞරවයක් ලැබීමට එය හේතුවේ. ප්‍රිය මිත්‍රවරුණි, ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරීමේ පළමු පියවර ලෙස සඳහන් කර ඇත්තේ තමාවම ප්‍රතික්ෂේප කිරීම මිස හුදෙක් තමා පියකරන සමහර දේවල් ප්‍රතික්ෂේප කිරීම නොවේ. තමා ආශාවන සමහර දේවල් නොව තමාවම ප්‍රතික්ෂේප කරන්න. යමෙක් මා පසුපස එන්නේ නම් ඔහු තමාම ප්‍රතික්ෂේප කරයි. එයින් අදහස් කරන්නේ කුමක්ද ..? එයින් අදහස් කරන පළමු දෙය නම්, තමාගේම ධර්මිෂ්ඨම අත්හැරීමයි. එය පළමු දේ වන අතර ඊට වඩා බොහෝ සෙයින් වැඩි දෙයක් ඊට අඩංගු වී තිබේ. තමාගේම ප්‍රඥාව මත රැඳී සිටීම, තමාගේම අයිතිවාසිකම අවධාරණය කිරීම, තමාගේම සැප පහසුව, තමාගේම සතුට, තමාගෙ ම උසස්වීම, තමාගේම ප්‍රතිලාභ සලකා බැලීම නතර කිරීම තමන්ම කල යුතුය. එය අපෝස්තුළු පාවුල් ප්‍රකාශ කරන දෙයින් අදස් කරන්නේ මම ජීවත්වීම යනු මා නොව ක්‍රිස්තුස් වහන්සේ ජීවත්වීමයි. මා ජීවත්වීම යනු ක්‍රිස්තුස් වහන්සේට කීකරුවීම, සේවය කිරීම, ගෞරව කිරීම සහ උන්වහන්සේ වෙනුවෙන් මාව වැය කිරීමයි. යමෙක් මා පසු පස එන්නේ නම් ඔහු තමාවම ප්‍රතික්ෂේප කළ යුතු යැයි අපගේ ස්වාමීන් වහන්සේ පවසන්නේ එම නිසාය. වෙනත් වචනවලින් පැවසුවහොත් ඔබගේ ජීවිතය යාගයක් ලෙස ඔප්පු කරන්න. **"එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමාන වූ ශුද්ධ වූ දෙවියන් වහන්සේ විසින් පිළින හැකි වූ යාගයක්කොට ඔප්පු කරන හැටියට දෙවියන් වහන්සේගේ දයාවක් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ."** (රෝම 12:1)

තමාගේම කුරුසිය රැගෙන .....

ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරීමේ දෙවන පියවර වන්නේ **"කුරුසිය රැගෙන යාමයි."** මාගේ මිත්‍රවරුණි, කිතුණු ජීවිතය නිෂ්ක්‍රීය සුඛෝපභෝගීත්වයට වඩා වැඩි දෙයි. එය බරපතල කටයුත්තකි. පරත්‍යාගශීලීව හික්මවා ගත යුතු ජීවිතයකි. ගෝලයෙකුගේ ජීවිතය ආරම්භ වන්නේ තමන්වම අත්හැරීමකින් සහ නොකඩවා තමන්වම යටත් කර ගැනීමෙනි. වෙනත් වචන වලින් කිවහොත් අපගේ බයිබල් පදයේ සඳහන් කුරුසිය හුදෙක් ඇඳහිල්ලේ වස්තුවක් ලෙස නොව ජීවිතයේ මූලධර්මයක් ලෙස ගෝලත්වයේ ලාංඡනයක් ලෙස, ආත්මයේ අත්දැකීමක් ලෙස හැඳින්වේ. එමෙන්ම නාසරීය යේසුස් වහන්සේට, පියාණන් වහන්සේගේ සිංහාසන වෙතට යාමේ එකම මාර්ගය කුරුසිය වූවාසේම කිතුණුවෙකුට දෙවියන් වහන්සේ සමඟ සහභාගීකමේ ජීවිතයක් ගත කිරීමට සහ අවසානයේ දී ඔටුන්න හිමිකර ගැනීමේ එකම මාර්ගය කුරුසිය හරහාය. පාපයේ වරද අවලංගු වූ විට කිරිස්තුස් වහන්සේගේ පූජාවේ නීත්‍යානුකූල ප්‍රතිලාභ ඇදහිල්ලෙන් සුරක්ෂිත වේ. නමුත් කුරුසිය අපගේ එදනෙදා ජීවිතයේ දී පාපයේ පැවතීමේ බලය අහෝසි කිරීමේ ඵලදායි බව අවබෝධ කරදෙනු ලබයි.

මතෙව් 16:21 වන පදයේ සිට ස්වල්ප වේලාවකට මට ඔබගේ අවධානය යොමු කිරීමට අවශ්‍යව තිබේ. **"එවක් පටන් යේසුස්වහන්සේ තමන් යෙරුසලමට ගොස් වැඩිවහල්ලන්ගෙන්ද, නායක පූජකයන්ගෙන්ද, ලියන්නන්ගෙන්ද බොහෝ දේ විඳින්ටත් මරනු ලබන්ටත් තුන්වෙනිදා නැගිටවනු ලබන්ටත් ඕනෑ බව ගෝලයන්ට දන්වන්ට පටන්ගත් සේක. එවිට පේතුරුස් උන්වහන්සේ කැඳවා තබවටු කරන්ට පටන්ගෙන, ස්වාමීනී, එය ඔබගෙන් දුරුවේවා. ඔබට කිසිකලෙකත් එසේ සිද්ධ නොවන්නේ යයි කීවේය."** (මතෙව් 16 : 21-22) පේතුරුස් තැති ගැන්මට ලක්ව ප්‍රකාශ කළ දෙයින් ලෝකයේ ප්‍රතිපත්තිය ප්‍රකාශ විය. එය ලෝකයේ දර්ශනය තුළ තමාවම ආරක්ෂා කර ගැනීම සාරාංශකොට දැක්වීමයි. ක්‍රිස්තුස් වහන්සේගේ දේශනාව පූජාවීම මිස ඉතුරු කර ගැනීම නොවීය. පේතුරුස්ගේ යෝජනාව තුළ සාතන්ගේ පෙළඹවීමක් ඇති බව යේසුස් වහන්සේ දුටු අතර උන්වහන්සේ තරවටු කරමින් එම යෝජනාව හෙළා දැමූ සේක. ඉන්පසු උන්වහන්සේ ගෝලයන් දෙසට හැරී පැවසුවේ "යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා ...." (මතෙව් 16:24) වෙනත් වචන වලින් පැවසුවහොත්, යේසුස් වහන්සේ පැවසුවේ කුමක්ද ..? මම යෙරුසලමට යනවා කුරුසිය දරා ගැනීමට යමෙක් මා ස්සේ එනවා නම් ඒ අයට ද දරා ගැනීමට කුරුසියක් ඇත. එනේම උන්වහන්සේ මෙලෙසද පැවසූ සේක. "තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලූක් 14:27) යේසුස් වහන්සේ යෙරුසලමට ගොස් කුරුසිය දරාගෙන මරණයට පත්වෙනවා පමණක් නොව උන්වහන්සේ පසුපස එන සැමකෙනෙක්ම කුරුසිය රැගෙන යා යුතුය. එය අනිවාර්යය සහ අත්‍යාවශ්‍ය වේ. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය පැහැර හැරිය නොහැකිය. එය උන්වහන්සේට සම්බන්ධ වන සියල්ලන් සමඟ බෙදාගන්නා බව තහවුරුවී තිබේ.

කුරුසිය පිළිබඳ ව්‍යාජ අදහස් (සංකල්ප)

කුරුසිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ... ? මනුෂ්‍යයෙක් තම කුරුසිය රැගෙන යාම ලෙස යේසුස් වහන්සේ අදහස් කළේ කුමක්ද .. ? ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන් වහන්සේගේ දරුවන් අතරේ අති මහත් බහුතරයකට කුරුසිය යන්නේ අදහස් කරන දේ පිළිබඳව ශුද්ධ ලියවිල්ලට පටහැනි සංකල්ප තිබීම වඩාත් කණගාටුදායකය. මෙම පදයේ සඳහන කුරුසිය සාමාන්‍යයෙන් කිතුණුවන් සලකන්නේ සෝදිසි කිරීම්, කදරදර ආදියයි. මොන කරදරයක් වුවත් අපගේ සමාදානය නැතිවෙනවා සහ මාංශයට අප්‍රසන්නව තිබෙනවා මෙන්ම අපගේ කේන්තිය ඇවිස්සීමට (අපහසුතාවයට පත්කිරීමට) උත්සහ කරනු ලබනවා ඇත. මෙය මාගේ කුරුසිය යැයි කෙනෙක් පවසන අතර තවත් කෙනෙක් මෙය මාගේ කුරුසිය යැයි ඔහුගේ කාරණා මත පවසනු ලබයි. ප්‍රිය මිත්‍රවරුණි, අඑත් ගිවිසුමේ කිසි විටෙකත් එසේ භාවිතා කර නැත.

කුරුසිය යන වචනය කිසිවිටෙකත් බහුවචනයකින් පවසා නැත. නැතහොත් ඊට පෙර ඇති අවිනිශ්චිත දෙයකින් කුරුසිය හමු නොවේ. අපි අවධානය යොමු කරන බයිබල් පදයේ කුරුසිය සම්බන්ධ වී ඇත්තේ ක්‍රීය ක්‍රියා පදයකට මිස නිශ්ක්‍රීය ක්‍රියා පදයකට නොවේ. එය ක්‍රිස්තුස් වහන්සේගේ වේදනාවේ ප්‍රමුඛ ලක්ෂණ පැහැදිලිවන නිශ්චිත යතාර්ථය් නිරූපණය කරයි.

තවත් අය තේරුම් ගන්නේ ඔවුන් අකමැත්තෙන් ඉටුකරන එකඟ විය නොහැකි රාජකාරී හෝ ඔවුන් අකමැත්තෙන් ප්‍රතික්ෂේප කරන මාංශයේ පුරුදු වෙත යොමුවීම බවයි. හෘදය සාක්ෂියට අනුව ඔවුන් උනන්දුවෙන් කැමති දේවලින් වැලකී සිටන විට තමාගේ කුරුසිය දරාගෙන සිටින බව විශ්වාස කරති. එවැනි අය සෑමවිටම ඔවුන්ගේ කුරුසිය අනිත් අයට පහරදිය හැකි ආයුධයක් ලෙස පත්කර ගනිති. ඔවුන් තමාවම ප්‍රතික්ෂේප කිරීමේ සිටගෙන අනිත් මනුස්‍යයන් තමන්ව අනුගමනය කළ යුතු බව අවධාරණය කරති. කුරුසිය පිළිබඳ එවැනි සංකල්ප සාවද්‍ය මෙන්ම වැරදි සහගතව තිබේ.

කුරුසියේ සැබෑ අර්ථය

දැන් ස්වාමීන් වහ්නසේ මට හැකියාව ලබාදෙන පරිදි කුරුසිය නියෝජනය කරන කරුණු තුනක් පෙන්වාදීමට මට ඉඩදෙන්න. පළමුව, කුරුසිය යනු ලෝකයේ වෛරයේ ප්‍රකාශනයයි. ලෝකය දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුස් වහන්සේට වෛර කළ අතර එම වෛරයේ අවසානය උන්වහන්සේට ඇණ ගැසීමෙන් ප්‍රකාශ විය. යොහාන් 15 වන පරිච්ඡේදයේ යේසුස් වහන්සේ හත්වරක්ම සඳහන් කළේ ලෝකය තමන් වහන්සේට සහ තමන් වහන්සේගේ සෙනගට එරෙහිව ලෝකයේ ඇති වෛරයයි. ඔබ සහ මම උන්වහන්සේව අනුගමනය කරන ප්‍රමාණයට සහ අපගේ ජීවිත උන්වහ්නසේගේ ජීවිතය ලෙස පැවතීමේ ප්‍රමාණයට එය සිදුවේ අපි ලෝකයේ කාරණා වලින් ටතට පැමිණ උන්වහන්සේ සමඟ ඇසුරු කරන ප්‍රමාණයට ලෝකය අපට වෛර කරයි.

එක් පුද්ගලයෙක් පැමිණ ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයෙක්වීමට ඉදිරිපත් වූ බව අපි සුභාරංචි පොත්වල කියවන්නෙමු. ඔහු ප්‍රථමයෙන් ගොස් තම පියාව භූමිදානය කර එන්නට අවසර ඉල්ලා සිටියේය. එය ඉතා ස්වභාවික ප්‍රශංසනීය ඉල්ලීමක් වන අතර ස්වාමීන් වහන්සේගේ පිළිතුර අතිශයින්ම පුදුම සහගතය. යේසුස් වහන්සේ ඒ මනුෂ්‍යායට මෙසේ පැවසූ සේක. **"යේසුස් වහන්සේද, මා අනුව වරෙන්න. මළාහු තවුන්ගේ මළවුන් භූවිදානකරත්වයි ඔහුට කීසේක."** (මතෙව් 8:22) ක්‍රිස්තුස් වහන්සේට කීකරු වූවානම් එම තරුණයාට කුමක් සිදුවේද ? ඔහු එසේ කළාද, නැද්ද කියා මම නොදනිමි. නමුත් ඔහු එසේ කලා නම් කුමක් සිදුවේවිද ... ? ඔහුගේ ඥතීන් සහ ඔහුගේ අසල්වැසියන් ඔහු ගැන සිතන්නේ කුමක්ද ? ඔහු කිරිස්තුස් වහන්සේව අනුග

6 පිටුවට

5 පිටුවෙන්

කුරුසිය දරාගැනීම...

මනය කිරීමට සහ මනුෂ්‍යයන් අතරේ පුතෙකුගේ වකීම නොලසකා හැරීමට හේතු වූ සිතුවිල්ල, කැපවීම අගේ කිරීමට ඔවුන්ට හැකිවේවිද .. ? මාගේ මිත්‍රවරුණි..., ඔබ ක්‍රිස්තුස් වහන්සේව අනුග මනය කරන්නේ නකම්, ලෝකය ඔබට ඔල්මාද යැයි සිතනු ඇත. සමහඑ ස්වභාවයන් සහ නැඹරුවීම් මනුෂ්‍යයන්ගේ සිහිබුද්ධියෙන් තේරුම් ගැනීම ඉතා අසිරුව තිබේ. ජීවත්ව සිටින අයගේ නින්දා කිරීම මළවුන්ගේ වියෝවීමට වඩා දුෂ්කර වූ සෝදිසි කිරීමක් බව සමහරු සලකති.

තවත් තරුණයෙක් ගෝලයෙක්වීම සඳහා ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණියේය. ඔහු ස්වාමීන් වහන්සේගෙන් අවසර ඉල්ලා සිටියේ තම නිවසට ගොස් මිතුරන්ගෙන් සමුගැනීමට ප්‍රථමයෙන් අවසර ලබාදෙන ලෙයසි. මෙය ඉතා ස්වභාවික ඉල්ලීමකි. **“එහෙත්, යේසුස් වහ්සේ ....., නගුලේ අත තබා ආපසු බලන කසිකෝ දෙවියන් වහන්සේගේ රාජ්‍යයට සුදුසු නැතැයි ඩහුට කී සේක.”** (ලුක් 9:62) නිවසේ තම ආදරණීයන්ගෙන් වෙන්වීමේ ස්වභාවය දරා ගැනීම ඉතා අසිරුය. ආදරණීයන් සහ මිතුරන් සුළුකොට තැබූ බව සැලකකිරීම තවමත් දුෂ්කරය. අප ක්‍රිස්තුස් වහන්සේව සමීපව ඇසුරුකරන්නේ නම් ලෝකයේ නිග්‍රහයට හසුවීම ඉතා සැබෑවේ. කිසිම මනුෂ්‍යයෙකුට ලෝකය සමඟ රැදෙමින් උන්වහන්සේව අනුගමනය කළ නොහැකිය.

තවත් තරුණයෙක් යේසුස් වහන්සේ ඉදිරියට පැමිණ උන්වහන්සේගේ පාමුල වැටී නමස්කාර කරමින් **“ආචාරීන් වහන්ස..., සදාකාල ජීවනය ලබාගන්න පිණිස මොන යහපත් දෙයක් කරවිදැයි උන්වහන්සේගෙන් අසුවේය.” (මතෙව් 19:16) යේසුස් වහන්සේ කුරුසිය ඉදිරිපත් කළ සේක. “යේසුස් වහන්සේ ද, නුඹ සවිස්තර්ණවෙන්ට කැමති නම් ගොස් නුඹ සන්තක දේ විකුණා දිළිඳුන්ට දීපන්න. එවිට ස්වර්ගයෙහිදී නුඹට වස්තු ලැබෙන්නේය. නුඹ මා අනුව යන්ට වරෙන්නැයි ඩහුට කී සේක. ”** (මතෙව් 19:21) තරුණයා ශෝකයෙන් පිටත්ව ගියේය. ක්‍රිස්තුස් වහන්සේ තවමත් ඔබටත්, මටත් පවසන්නේ "තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලුක් 14:27) කියා වන සේක. කුරුසියෙන් අදහස් කරන්නේ ලෝකයේ නින්දාව සහ වෛරයයි. නමුත් කුරුසිය වෙත යේසුස් වහන්සේ ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වූ අතර ගෝලයන්ටද එසේම විය යුතුය. එය වළක්වා ගැනීමට හෝ පිළිගැනීමට නොසලකා හැරීමට හෝ දරා ගැනීමට හැකිය.

තම කැමැත්තෙන්ම කීකරුවීම

එහෙත් දෙවනුව කුරුසිය දෙවියන් වහන්සේගේ කැමැත්තට ස්වේච්ඡාවෙන්ම ටහත් වූ ජීවිතයක් නියෝජනය කරයි. ලෝකයේ දෘෂ්ඨිකෝණයෙන් යේසුස් වහන්සේගේ මරණය ස්වේච්ඡා පූජාවකි. යොහාන් 10:17-18 පද වෙතට මොහොතකට හැරෙන්න. **“මා විසින් නැවත ගන්නා පිණිස මාගේ ප්‍රාණය දෙන බැවින් මාගේ පියාණන් වහන්සේ මට ප්‍රේම කරන සේක. කිසිවෙක් ඒක මාගෙන් උදුරගන්නවා නොව මමම ඒක දෙවි. ඒක දෙන්ට මට බලය තිබේ. මේ ආඥාව මාගේ පියාණන් වහන්සේගෙන් ලද්දිසි කී සේක.”** උන්වහන්සේ මෙලෙස තම ජීවිතය පූජා කළේ ඇයි .. ? යොහාන් 10:18 වන පදයේ අවසාන වාක්‍යය දෙස බලන්න. **“මේ ආඥාව මාගේ පියාණන් වහන්සේගෙන් ලද්දිසි කී සේක.”** කුරුසිය දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන්ගේ කීකරුකම ම ඉල්ලා සිටි අවසාන ඉල්ලීම විය. පිලිප්පි 2 වන පරිච්ඡේදයේ අපි මෙලෙස කියවන්නෙමු. **“උන්වහන්සේ, දෙවියන් වහන්සේගේ රූපාකාරය දැක්ක සේක්, දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගනම සිටිය යුතු වස්තුවකැයි නොසිතා එය ඉවත්කර දාසයෙකුගේ ස්වරූපය ගෙන මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැවිණී සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය එසේය කුරුසියේ මරණය දක්වා කීකර වූ සේක.** ”(පිලිප්පි 2:6-8)

අපි උන්වහන්සේගේ පියවර අනුගමනය කළ යුතු බවට ක්‍රිස්තුස් වහන්සේ අපට ආදර්ශයක් තබා තිබෙන සේ. කිතුණුකුගේ කීකරුකම තුළ තිබිය යුත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ කීකරුකම තුළ තිබූ කාරණය ස්වේච්ඡාවෙන් කීකරුවීම නොකඩවා කීකරුවීම, විශ්වාසවන්තව කීකැවීම, මරණය දක්වා කීකරුවම, ඊට ඇතුළත්ය. එම නිසා කුරුසිය යනු කීකරුකම, කැපවීම, යටත්වීම, දෙවියන් වහන්සේගේ අභිමතය පරිදි තබා ඇති ජීවිතයයි. **“එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කතාකොට යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඩහු තමාම නොසලකා තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා. (මතෙව් 16:24) තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය.”** (ලුක් 14:27) වෙනත් වචනවලින් කිවහොත් කුරුසිය නියෝජනය කරන්නේ ගෝලත්වයේ මූලධර්මයයි. අපගේ ජීවිත ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිපත්තීන්ම ක්‍රියාත්මක වේ. උන්වහන්සේ මෙහි පැමිණ තමන් වහන්සේව සතුටු කර ගැනීමට ක්‍රියා නොකළ සේක. උන්වහ්නසේ තමන් වහන්සේගේ කීර්තිය සෙව්වේ නැත. උන්වහන්සේ යහපත කරමින් ගමන් කළ සේක. උන්වහන්සේ උපස්ථාන ලැබීමට නොව උපස්ථාන කිරීමට පැමිණි සේක. කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක. අපිත් එලෙස විය යුතුය.

කුරුසියෙන් අදස් කරනු ලබන්නේ, පළමුව ලෝකයේ නින්දාවට හසුවීමට සිදුවන බවයි. මක්නිසාද අපි ඊට විරුද්ධව සිටින්නෙමු. ලෝකයෙන් අපගේ ජීවිත වෙන්කරගෙන සහ ලෝකයේ මූලධර්ම වලින් වෙනස් වූ මට්ටමක ක්‍රියාත්මක වී ගමන් කරන බැවින් ලෝකය අප සමඟ කෝපව සිටිති. දෙවනුව, දෙවියන් වහන්සේට කැපවූ පූජාවක් ලෙස අපගේ ජීවිත කැපකර ඇත.

අන් අය වෙනුවෙන් කැපවීම.

තුන්වෙනුව, කුරුසිය අනිත් අය වෙනුවෙන් පූජාවීම සහ දුක්වේදනා නියෝජනය කරනු ලබයි. **“ අප ප්‍රේමය දැනගෙන සිටින්නේ ඒ තැනැත්වහන්සේ තමන් ප්‍රාණය අප උදෙසා දුන් හෙයින්ය. අප විසින් සහෝදරයන් උදෙසා අපේ ජීවිත දෙන්ට යුතුය.”** (1 යොහාන් 3:16) කල්වාරියේ තර්කය එයයි. ක්‍රිස්තුස් වහන්සේ සමඟ සම්බන්ධතාවය ඇතිව සිටීමට අපව කැඳවා ඇත. අපිත් යේසුස් වහන්සේගේ ජීවිතයේ පැවතුණා වූ මූලධර්ම ඇතිව දෙවියන් වහන්සේට කීකරු වෙමින් අනිත් අය උදෙසා කැපවිය යුතුය. උන්වහන්සේ මරණයට පත්වූයේ අපට ජීවනය ලබාදීමට වන සේක. මක්නිසාද යමෙක් තමාගේ ජීවිතය ගලවාගන්ට කැමතිවේද ඒක ඔහුට නැතිවන්නේය. මා නිසා තමාගේ ජීවිතය නැති වෙන අයට ඒක සම්බවන්නේය. (මතෙව් 16:25) එහි අදහස් කරන්නේ යේසුස් වහන්සේ සෑම කිතුණුවෙකුටම ගෝලයන්ට මෙන් කථාකරනු ලැබූ බවයි. ආත්මාර්ථකාමී ජීවිතයක් ගතකරන සෑම කිතුණුවෙකුම තමාගේම සැප පහසුකම, තමාගේම මනසේ සහනය, තමාගේම සුභසාධනය, තමාගෙ ්ම වාසි සහ ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් ජීවනය සදාකාලයටම අහිමි කර ගනිමින්, සදාකාලික සියලු දේ නැති කර ගනිති. දැව සහ පිදුරු වලින් දුමක් නගිනු ඇත. නමුත්, "මා නිසා තමාගේ ජීවිතය නැති වෙන අයට ඒක සම්බවන්නේය." එනම් තමාගේම යහපත තමාගේම ලාභය, තමාගේම දියුණුව, සලකා බලා ජීවිතය ගත නොකල නමුත් තම ජීවිතය කැප කළ තැනැත්තා ක්‍රීස්තුස් වහන්සේ වෙනුවෙන් අන් අය උසො එය වැය කළේය. ඔහු සොයාගනු ලබන්නේ වෙන දෙයක් නොව උන්වහන්සේගේ ජීවනයයි. ඒ ජීවිතය අමරණීය සදාකාලික එකක්ය. එය ගොඩනගා ඇත්තේ නොබෙදිය හැකි ද්‍රව්‍ය වලින් වන අතර එය අනාගතයේ දී ගින්නෙන් සෝදිසි කරන කළ දැවී යන්නේ නැත. අපට ජීවනය ලබාදීමට ක්‍රිස්තුස් වහන්සේ මැරුණු අතර අප ජීවත්වීමට නම් අපි මරණයට පත්විය යුතුය.

යේසුස් වහන්සේ නැවතත් උන්වහන්සේගේ ගෝලයන්ට මෙසේ පැවසූ සේක. **“යේසුස් වහන්සේ නුඹලාට සමාදානය වේවයි නැවතත් ඩවුන්ට කියා පියාණන් වහන්සේ මා එවූවාක් මෙන්ම මවත් නුඹලා යවවියි කී සේක.”** (යොහාන් 20:21) යේසුස් වහන්සේ මෙහි පැමිණියේ කුමකටද .. ? පියාණන් වහන්සේව මහිමයට පත්කිරීමට. දෙවියන් වහන්සේගේ ප්‍රේමය පෙන්වීමට, දෙවියන් වහන්සේගේ දයාව දැක්වීමට යෙරුසලම ගැන කඳුළු සැලීමට, ප්‍රතික්ෂේප කරනු ලැබූ (නොසලකා හරිනු ලැබූ) අයට සහ මංමුලා වූ අයට අනුකම්පා කිරීමට කෑමට තරම්වත් විවේකයක් නැති තරමට වෙහෙසවී වැඩ කිරීමට වූ සේක. **“ උන්වහන්සේ ගෙදරකට පැවිණී සේක. ඩවුන්ට කෑව කන්ට පවණවත් අවකාශ නැතිවෙන තරමට සමූහයා නැවත රැස්වුණෝය.”**(මාර්ක් 3:20) එමෙන්ම, පියාණන් වහන්සේ මා එවූවාක් මෙන් මමත් නුඹලාව යවමියි යේසුස් වහන්සේ කී සේක. තවත් ආකාරයකින් කියනවා නම්, මම ඔබව ගලවාගත් ලෝකය වෙතට ඔබව නැවත යවමි. මම ඔබව නැවත ලෝකයට යවන්නේ කුරුසිය නැමති සංඛේතය ඔබ මත තබාගෙන ජීවත්වීමටය.ප්‍රිය සහෝදරයෙනි, අපගේ ජීවිතවල ලේ කොයිතරම් සීමිතද ... ? අපගේ ශරීර තුළ යේසුස් වහන්සේගේ මරණය දරා ගැනීම කොයිතරම් කුඩා විය හැකිද .... ? (2 කොරින්ති 4:10)

කුරුසියට පංගුකාර විය යුතුය.

සියලුදේවලදී අපි කුරුසිය දරා ගැනීමට ආරම්භ කර තිබෙනවාද .... ? අපි මෙතරම් දුරින් උන්වහන්සේ පසු පස යාම පුදුමයක් නොවේද .... ? පාපයේ බලය තුළ වාසය කරන අපි එතම් කුඩා ජයග්‍රහණයක් ලබා තිබීම පුදුමයක්ද .... ? ඊට හේතුව ක්‍රිස්තු වහන්සේගේ ගෝලයන් වන අප විසින් උන්වහ්සේගේ කුරුසියට පංගුකාර නොවීමයි. නීත්‍යානුකූලව කල්වාරි කුරුසියේ දී අපගේ වරද අවලංගු කර අපගේ පාපවල වරද ඉවත් කළ ක්ක. නමුත් ප්‍රිය මිත්‍රවරුණි, අපගේ ජීවත පාපයේ බලයෙන් මිදීමට සහ අප තුළ සිටින පරණ මනුෂ්‍යයා කෙරෙහි බලය පැවැත්වීමට ඇති එකම මාර්ගය කුරුසිය අපගේ ආත්මයේ අත්දැකීමෙන් කොටසක් බවට පත්වීම බව මම හොඳින් ඒත්තු ගෙනඅ ැත. කුරුසිය පාපය නීත්‍යානුකූලව අහෝසි කර ඇත. ගෝලයන් විසින් කුරුසිය දරාගත්විට පමණක් එය අත්දැකීමක් බවට පත්වී අප තුළ ඇති පිපයේ අපවිත්‍රකම සහ මරණයේබලය විනාශකර දමනු ලබයි. යේසුස් වහන්සේ මෙසේ කී සේක. තමාගේ කුරුසිය රැගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ මාගේ ගෝලයා වෙන්ට බැරිය. සෑම කිතුණුවෙකුටම ඇති අවශ්‍යතාවය කුමක්ද ... ? ස්වාමීන් වහන්සේ සමඟ තනිව සිට උන්වහන්සේගේ සේවයට කැපවීමයි.

“..... ඒ වනාහී තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේය. , (කොලොස්සි 1:27)

මාව ඔබගේ හදවතට එකඟ මනුෂ්‍යයා කරන්න

(ඩබ්ලව්. ජේ. සමිත විජේතුංග) (1889 - 1986)

දවියන් වහන්සේ අපව උන්වහන්සේ වෙනුවෙන් නිර්මාණය කර තිබෙන සේක.

1927 නොවැම්බර් මාසයේ 08 වෙනි දින මාගේ තිස් අටවෙනි උපන්දිනයේදී දී ස්වාමනි මාව ඔබගේ හදවතට එකඟ වූ මනුෂ්‍යයෙක් කරන්න කියා යාච්ඤා කළෙමි. කලින් කළා වූ වැඩ කටයුතු නොපෙනී ගියේය. කලින් වැදගත් යැයි පෙණුන දේවල් අතුරුදහන් විය. මා උනන්දු වූ සෑම දෙයක්ම දෙවෙනි තැනට පත්විය. දෙවියන් වහන්සේ ඉදිරියේ මාගේ අභ්‍යන්තර ජීවිතය වැදගත් වූයේය. සැබවින්ම එය වටිනා සියල්ලයි. එදින මාගේ කාමරයේ එහා මෙහා යමින් ස්වාමීනී, මාව ඔබගේ හදවතට එකඟ මනුෂ්‍යයා කරන්න කියා යාච්ඤා කළෙමි. මම කවදාවත් ඉකලා නැති විදිහට මම කරන වැඩ මම ලියන පොත්, මම කරන දේශනා, රැස්වුණ සෙනඟ මාගේ සාර්ථකත්වය නොවෙයි කියා මම දුටුවෙමි. නමුත් ඒ වෙනුවට මා ගත කළ ජීවිතයේමා සිතමින් සිටි සිතුවිලි වල තිබූ හදවතේ ශුද්ධකම ප්‍රායෝගික ධර්මිෂ්ඨකම ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ වෙන්වීමට මාගේ හැරීම වචනවල පමණක් තිබූ බව දුටුවෙමි.

දෙවියන් වහන්සේ සමඟ සමීපව ගමන් කිරීම සඳහා යන වචන වෙත කවදාටත් වඩා නව සහ ගැඹුරු අර්ථයක් ඇතිව මා වෙත පැමිණියේය. එවැනි අත්දැකීමක් නිසා මාගේ හදවත වේදනාවෙන් හඬා වැටුණි. **"උන්වහන්සේ හා උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත්, උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය."** (පිලිප්පි 3:10) අපෝස්තුළු පාවුල් නැවතත් මෙසේ කීවේය. **"අන්‍යජාතීන් අතරේ තිබෙන වේ භාසේ තේජන් සම්පත කිවෙක්ද කියා දෙවියන් වහන්සේ ශුද්ධවන්තයන්ට දන්වන්ට කැමති වූ ේක. ඒ වනාහී තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේය." (කොලොස්සි 1:27) "මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කූරැසියෙහි ඇණ ගසනු ලැබ සටිමි. එසේ වී නමුත් මම ජීවත්වෙමි. නමුත් නවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. ....."** (ගලාති 2:20) **"....නෝවා දෙවියන් වහන්සේ සමඟ හැසුරුණේය."** (ප්‍රතිපත්ති 6:9) **"නවද ඒතොක් දෙවියන් වහන්සේ සමඟ හැසුරුණේය."** (උත්පත්ති 5:24) මට එසේ කිරීමට බැරිද ...? මගේ වැඩවලට, මගේ වස්තුවට (මා සතු දේවලට) වඩා දෙවියන් වහන්සේට මාව වටින්නේ නැද්ද .. ? දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ මාව මිස මගේ සේවය පමණක් නොවේ.

මාව භාර ගන්නා, මම සදාකල්හිම ඔබවහන්සේ වෙනුවෙන් පමණක් වන්නෙමි.

ඉන්පසුව උන්වහන්සේ යාච්ඤාව තුළ මාව පිටතට ගෙන ගිය සේක. උන්වහන්සේගේ හදවතට එකඟ වූ මනුෂ්‍යයෙක් කරන්න කියා යාච්ඤාවෙන් ඉල්ලා සිටියෙමි. ස්වාමීනී මෙන්න මගේ දෑත් මම ඒවා ඔබවහන්සේට කැප කරමි. ඔබවහන්සේට අගෞරවය වන කිසි දෙයක් නොකරමි. ස්වාමීනී, මෙන්න මාගේ දෙපා ඒවා මම ඔබට කැප කරමි. ඔබවහන්සේ අකමැති තැනකට මම කිසිදා නොයන්නෙමි. ස්වාමීනී, මෙන්න මාගේ දෑස් ඔබවහන්සේව දුක්වන කිසිවක් දෙස නොබලනු ඇත. ශුද්ධාත්මයාණන් වහන්ස..., ඔබවහන්සේට අගෞරවයක් වන කිසිවක් ඇසීමට මගේ කන් කිසිදා නොඇරේවා. ඔබවහන්සේට අකමැති කිසි වචනයක් කථා කිරීමට මගේ මුඛය කිසිදා නොඇරේවා. ඔබවහන්සේගේ අභිමුඛත්වය හැරීම අඳුරු කරන කිසි සිතුවිල්ලක් හෝ කල්පනාවක් මගේ මනස තුළ කිසිවිටෙකත් නොරැඳේවා. ඔබවහන්සේගෙන් නොවන කිසිවකට ඇළුම්වීමට එවැනි කිසිදු හැරීමකට මගේ සිත තුළ ඉඩ නොතිබේවා. ආමේන් .....

ස්වාමීනී...., මගේ මිතුරන්, කාලය, භූමික ගබඩාව ආත්මය, ශරීරය ඔබේ වීමට ඒවා සියල්ල සදහටම ඔබට භාරදෙමි. මම යාච්ඤා කළ විට මේ වච මා වෙතට පැමිණියේය. **"එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධ වූ දෙවියන් වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන් වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉලලමි. එය නුඹලාගේ ආත්මක සේවය වේ. නුඹලා වේ ලෝකයේ ආකාරයට සමාන නොවී දෙවියන් වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතු වූ සම්පූර්ණ වූ දෙය කුමක් ද කියා දැගන්නා පිණිස සිත අළුත්කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා."** (රෝම 12:1-2)

"එබැවින් නුඹලාගේ මරණීය වූ ශරීරයේ තෘෂ්ණාවලට කීකරු වන ලෙ පාපය එහි අධිපතිකම් නොකෙරේවා. නුඹලාගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධකොට පාපයට භාර නොදී නුඹලාම මළවන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන් වහන්සේට භාරවී නුවළාගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ ආයුධකොට උන්වහන්සේට බාරදීපල්ලා. කුමක් මෙයින් ද නුඹලා ව්‍යවස්ථාව යටතෙහි නොව අනුග්‍රහය යටතෙහි සිටින බැවින් පාපය නුඹලා කෙරෙහි අධිපතිකම් නොකරන්නේය." (රෝම 6:12-14)

දෙවියන් වහන්සේට මුල් ස්ථානයදීම

දෙවියන් වහන්සේ මගේ නොබෙදුනු අවධානය ඉල්ලා සිටිනවා මම දුටුවෙමි. අනෙක් සියලුම දේ දෙවෙනි ස්ථානය ගත්තේය. ආදරණීයයන්, මිතුරන්, නිවස, මුදල්, රැකියාව යන සියල්ල සාධාරණ කාරනා වුවත් ප්‍රථම ස්ථානය ක්‍රිස්තුස් වහන්ට ලබාදිය යුතුය. දිවා රෑ මාගේ නොබෙදුනු අවධානය උන්වහන්සේ වෙත යොමු කළ යුතුය. පළමුව දෙවියන් වහන්සේ යන්න මගේ ආකල්පය විය යුතුය. මට ආශිර්වාද කිරීමට සහ මාව පාවිච්චි කිරීමට උන්වහන්සේට හැකිවන්නේ එවිටය. උන්වහන්සේගේ ප්‍රේමණීය හදවත ස්පර්ශ කරමින් තෘප්තිමත් කළ හැකිවන්නේ එසේ කිරීමෙන් පමණි.

දෙවියන් වහන්සේ මඟ ඇති මගේ සම්බන්ධතාවය අතරම වෙනත් කිසිවක් හෝ අන්කිසිවෙක් නොපැමිණිය යුතුය. දෙවියන් වහන්සේට මගේ හදවතේ මුල් ස්ථානය දිය යුතුය. දෙවියන් වහන්සේ සමඟ ඇති මගේ සම්බන්ධතාවය සම්පූර්ණ විය හැකි වන්නේ මගේ නොබෙදුණු අවධානය යොමු වූ විට පමණි. සියල්ල යේසුස් වහන්සේ වෙන්වෙන්ය. මගේ පැවැත්මේ සියලු බලයන්, මගේ සියලු සිතුවිලි, වචන සහ ක්‍රියාවන්, මගේ සෑම දසක්ම සහ සෑම පැයක්ම උන්වහන්සේ උදෙසාය. එදා උන්වහන්සේ මගෙන් ඇසූදේ සෑම දෙනාගෙන්ම එක ලෙස අසන සේක. උන්වහන්සේට අප තුළ ඇති අයිතිය ප්‍රතික්ෂේප කළ හැකිද ...?

දෙවියන් වහන්සේගේ ස්ථානය ගැනීමට සුදුසු කිසිවක් මේ ලෝකයේ පවතිනවාද ... ? එසේ නම් උන්වහන්සේ ඉල්ලන දේ අපි නොසලකා සිටින්නේ ඇයි .. ? දෙවියන් වහන්සේගෙන් පිටතදී සැබෑ ප්‍රීතිය සොයාගත හැකිද ... ? අපට වෙනත් කිසි දෙයක් සමඟ ප්‍රීතිවීමට, තෘප්තිමත්වීමට හැකිද .. ? **"නවද උන්වහන්සේ කතාකොට සියලු ආකාර ලෝභකමෙන් ප්‍රවේශවී වෙන්ට බලාගනිල්ලා. මක්නිසාද වුනෂ්‍යයෙකුට කොපමණ දේපල තිබුණත් ඔහුගේ ජීවිතය එහි පිහිටා නැතැයි ඔවුන්ට කී සේක. "** (ලුක් 12:15)

අපගේ සහභාගීත්වයට සහ එක්සත්කමට දෙවියන් වහන්සේ ආශා කරන සේක. දුෂ්ඨ සහ විකෘති පරම්පරාවක් මධ්‍යයේ මෙහොතින් මොහොත උන්වහන්සේ සමඟ ගමන් කිරීමටත්, සාතන් දෙවියන් කොටගත් ලෝකයක ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් වෙන් නොවී සිටීමටත්, අපගේ ස්වාමීන් වහන්සේව කුරුසියේ ඇණ ගැසූ ලෝකයක වන්දනාකරුවන් සහ ආගන්තුකයන් ලෙස ජීවත්වීමටත් සැලැස්වීම අප වෙනුවෙන් දෙවියන් වහන්සේගේ සැලැස්ම සහ අරමුණයි. දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ අපි උන්වහන්සේ වෙනුවෙන් 100% ක්ම සිටීමයි. එම නිසා ප්‍රශ්නය වී තිබෙන්නේ අපි යේසුස් වහන්සේ වෙනුවෙන් පිටතට යනවාද .... ? නැති නම් යේසුස් වහන්සේගෙන් පිටතට යනවාද යන්නයි. අපි සම්පූර්ණයෙන්ම යේසුස් වහන්සේගේ ද ... ? දෙවියන් වහන්සේගේ හදවතට එකඟ වූ මනුෂ්‍යයෙකු යනු දෙවියන් වහන්සේට මුල්තැනදීමයි. සෑම මොහොතකම උන්වහනසේ සමඟ ගමන් කිරීමට, උන්වහන්සේ සතුටු නොවන කිසිවක් නොකිරීමට සහ උන්වහන්සේ වේදානවට පත්කරන කිසිවකට ඉඩ නොදීමට උන්වහන්සේ ඉදිරියේ ප්‍රායෝගික හා ධර්මිෂ්ඨ ජීවිත ගත කිරීමට, නොබෙදුනා වූ අපගේ අවධානය තුළ සැබෑ ලෙස උන්වහ්නසේට ප්‍රේම කිරීම ඇතිව සිටිමු.

මක්නිසාද අපි ක්‍රිස්තුස් වහන්සේට සමාන වන්නේ මේ ආකාරයටය. දෙවියන් වහන්සේට අප කෙරෙහි ඇති ඉහළම අභිලාෂය එයයි. අපි උන්වහන්සේගේ පුත්‍රයාණන් හා සමානව එම රූපාකාරය බවට පරිවර්තනයවීමට හැකිවන්නේ උන්වහ්නසේගේ අභිමුඛත්වයේ බොහෝ කාලයක් වැය කරන අයට පමණ. නොබෙදුනාවූ අයට පමණක් උන්වහන්සේව සැබවින්ම දැන හඳුනාගත හැකිය. උන්වහන්සේගෙන් හොඳම දේ ලබා ගැනීමට නම් අප අපගේ හොඳම දේ (උපරිම දේ) දිය යුතුය. උන්වහන්සේගේ හදවතට එකඟවූ පුරුෂයන් සහ ස්ත්‍රීන් වීමට නම් අපි අපගේ නොබෙදුනාවූ අවධානය උන්වහන්සේට ලබාදිය යුතුය. ජයග්‍රහණය ලැබීමට නම් අපි යටත් විය යුතුය. ජීවත්වීමට නම් අපි මරණයට පත්විය යුතුය. ලබා ගැනීමට නම් අපි දිය යුතුය.

දෙවියන් වහන්සේගේ හදවතට එකඟ වූ ජීවිතයකට මිහිරිබව උන්වහන්සේගේ ඇසුරේ ප්‍රීතිය පොළොවේ වෙන කිසිවකින් ලබාත නොහැකිය. සියළුම සාර්ථකත්වයන් ලැබුවත් එයට සමාන කළ නොහැකිය. උන්වහන්සේ මිටියාවතේ ලිලී මල සහ උදෑසන දීප්තිමත් තරුව වේ. ශාරොන්හී රෝසමල් දහසක් අතරේ ප්‍රදාන සහ සම්පූර්ණයෙන්ම අනර්ඝ වූ මලය. මිතුරෙකුට කිසිදාක එවැන්නක් කළ නොහැකිය. ආදරණීයයන් පවා බලාපොරොත්තු සුන්කර දමයි. මුදල් එහි බරද, කීර්තිය එහි තිත්තකමද ගෙන එයි. නමුත් උන්වහ්නසේ සතුට ගෙන එන සේක. දෙවියන් වහන්සේ කිසිවිටෙකත් බලාපොරොත්තු සුන්කරන්නේ නැත. උන්වහන්සේ සමඟ ගමන් කිරීම මිහිපිට ඇති මිහිරිම දෙයයි. සියලුම දේ හොඳින් සිදුවන බවත්, ඒ අතර කිසිවක් නොමැති බවත්, පාපයේ වළාකුලක් උන්වහන්සේගේ මුහුණ සඟවා නොගන්නා බවත්, දැන ගැනීම සැබවින්ම ස්වර්ගීය අත්දැකීමයි.

"මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි බලවත්නේය....." (ග2 කොරින්ති 5:14)

Reg. No: Dop/News/36/2024
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

දෙවියන් වහන්සේ ප්‍රකාශවන විට පිඹිදීම ඇති වේ.

අපගේ නිවෙස්වලට පිඹිදීම අවශ්‍යය, අපගේ සභාවලට අපගේ ජාතියට පිඹිදීම අවශ්‍යය. ලෝකයට යේසුස් වහන්සේව අවශ්‍යව තිබේ. යුද්ධ ශක්තියට පිඹිදීම ගෙන ඒමට නුපුළුවන. ආර්ථිකය ඉහළ මට්ටමකට පැමිණීමෙන් පිඹිදීම ඇති කළ නොහැකිය. චන්දයට පිඹිදීම ගෙන ඒමට නුපුළුවන. පිඹිදීම සර්වබලධාරී දෙවියන් වහන්සේගේ ක්‍රියා කිරීමයි.

යෙසායා 64 වන පරිච්ඡේදය තුළ දෙවියන් වහන්සේගේ සෙනඟ වහල් බවේ සිට මොරගැසුවෝය. උන්වහන්සේගේ ක්‍රියාව අත්හැර දැමීම සහ උන්වහ්සේගේ සෙනඟ අධෛර්යයට පත්ව සිටීම (බලාපොරොත්තු කඩවීම) නිසා වර්තමානයේ දී බොහෝ සෙනඟ මේ තත්ත්වයට පත්ව සිටින්නෝය. ලෝකය, මාංශය සහ සාතන් කරුණුකොටගෙන වහල්කමට හසුවී සිටීම පිළිබඳව සභාව මොරගසන්නෝය. කිතුණුවෙන් අධෛර්යයට පත්වී ඇත. බොහෝ දෙනාට පිඹිදීම පිළිබඳව බලාපොරොත්තුවක් නැත. පිඹිදීම ඇතිවිය හැකි යැයි ඔවුන් විශ්වාස කරන්නේ නැත. පිඹිදීම ඇතිවිය හැකිව තිබෙනවා පමණක් නොව, දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේ සමග හරිගැස්සෙන විට එය වැළැක්විය නොහැකිය.

පිඹිදීම ඇතිවී නැත්තේ ඇයි ..... ? සභාවල ඇති ප්‍රතිසංස්කරණවාදී මත නිසා නොවේ. දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ බෙදීම් පවතින නිසාම නොවේ. අපි ලොකික වී සිටින නිසා හෝ ලෝකය සමඟ සම්මුතියකට (එකඟතාවයකට) පැමිණ සිටින නිසා නොවේ. මිත්‍රවරුණි අපි මේ සියලුම කාරණා වෙනස් කළත් තවමත් පිඹිදමක් ඇති නොවනු ඇත. පිඹිදීම ඇති නොවීමට හේතු මේවා නොවේ. මේවා පිශිදීම නැතිකමේ ප්‍රතිඵලයයි. එසේ නම් පිඹිදීම යනු කුමක්ද ... ? දෙවියන් වහන්සේ පහළට පැමිණිවිට පිඹිදීම ඇති වේ.

"අහෝ ..... ඔබගේ එදිරිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔබ ඉදිරියෙහි ජාතීන් වෙව්ලවන පිණිසද, ඔබවහන්සේ අහස පලාගෙන බසින්ටත්, ගින්න කැළැව දැල්වන්නාක් වෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් වෙන්ද , ඔබ ඉදිරියෙන් කඳු දියවයන්ටත් යෙදුනොත් හොඳය. " (යෙසායා 64 : 1-2)

පිඹිදීම යනු සර්වබලධාරී දෙවියන් වහ්නසේව මුල ගැසීමයි. අපි අතරේ බොහෝ දෙනා දෙවියන් වහන්සේව සොයන්නෙමු. මක්නිසාද අපගේ පවුල් තුළ සභාවන් තුළ, අපගේ ජාතිය තුළ උන්වහන්සේ යම් දෙයක් කරනු දැකීම අපට අවශ්‍යව තිබේ. නමුත් අපි සොයන්නේ දෙවියන් වහන්සේගේ දැත් මිස (උන්වහන්සේගේ ක්‍රියා කිරීම මිස) උන්වහන්සේගේ මුහුණ නොවේ. අපගේ හදවත් දෙවියන් වහන්සේ උදෙසා දැඩි සෙයින් ආශා කළ යුතුය. ස්වාමී වූ දෙවියන් වහන්ස පහළට වැඩිය මැනව කියා අපි පැවසිය යුතුය.

දෙවියන් වහන්සේ පහළට පැමිණීමට ප්‍රේමකරන සේක. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ සෙනඟට මගපෙන්වන පණිස ගිනිටැඹක් සහ වළාකුලක් ලෙසින් පහළට පැමිණිය සේක. දෙවියන් වහන්සේ , උන්වහන්සේගේ තේජසින් යුතුව සම්මුඛවීමේ කුඩාරම මතට පැමිණ එය උන්වහන්සේගේ අතිශුද්ධකමෙන් පූර්ණ කළ සේක. යේසුස් වහන්සේ ස්වර්ගයේ සිට පැමිණ අපව ගළවා ගත් සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ පෙන්තකොස්ත දවසේදී පහළට පැමිණ අපව ගළවා ගත්සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ පෙන්තකොස්ත දවසේදී පහළට පැමිණ පළමු සභාව උන්වහ්නසේගේ බලයෙන් යුක්තව බොතිස්ම කළ සේක. යේසුස් වහන්සේ නැවත පැමිණෙන සේක. ඔබ වර්තමානයේ දී සභාවේ ඉතිහාසය අධ්‍යයනය කරනවා නම්, අවස්ථාවෙන් අවස්ථාවට විවිධ වූ ස්ථානවල දෙවියන් වහන්සේ පහළට පැමිණ ඇති බව ඔබ දකිනවා ඇත.

සභාව වෙතට දෙවියන් වහන්සේ පලට පැමිණීම මට උවමනාවී තිබේ. අප පිඹිදීමට පෙර ඔබගේ දේශය වෙනස් කළ යුතු යැයි අදහස් නොකරන්න. මාගේ මිත්‍රය, පුද්ගලිකව ඔබට පිඹිදීමට පැමිණිය හැකිය. ඔබගේ ඉරිදා පන්තිය තුළ පිඹිදීම ලැබීමට පුළුවන. ඔබගේ පවුල තුළ පිඹිදීම ලැබීමට පුළුවන. පුද්ගලයෙක් ලෙස ඔබ සිටින කුමන ස්ථානයකදී වුවත් ඔබට පිඹිදීම ලැබීමට පුළුවන.

දෙවියන් වහන්සේගේ පැමිණීම පිඹිදීම ඇති කරයි.

දෙවියන් වහන්සේ පැමිණි විට කාරණා සිදුවන්නේය.

✸ **කඳු දියවයන්නේය** :- **"ගින්න කැළැව දැල්වන්නාක් වෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් වෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියවයනටත් යෙදුනොත් හොඳය."** (යෙසායා 64 :2) උඩඟුකමේ කන්ද, ආත්මික මානයක එල්ඹගෙන සිටීම සහ උදාසීනකම, දෙවියන් වහන්සේගේ කියා කිරීමට බාධාවකි. ඒවා දියවී යා යුතුය. සර්ව බලධාරී දෙවියන් වහන්සේගේ පිඹිදීමේ ගින්න නතර කිරීමට කිසි දෙයකට නොහැකිය. බොහෝ කඳු සහ බොහෝ බාධාවන් තිබෙනවා යැයි පවසමින් දෙවියන් වහන්සේට නිග්‍රහ නොකරන්න. මක්නිසාද දෙවියන් වහන්සේ පහළට පැමිණෙන විට කඳු දියව යන්නේය.

✸ **පව්කරුවන් වෙවුලනු ලබන්නෝය** :- **"අප බලා නොසිටිය භයානක දේ කරමින් ඔබ බැස්ස සේක. ඔබ ඉදිරියේ කඳු දියව ගියේය."** (යෙසායා 64 :3) නැති වූ අය ඔවුන්ට පැහැදිලි කළ නොහැකි දෙයක් දුටු විට ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් වැටී සිටින්නා වූ වරද පෙන්වා දෙන අතර පව්කරුවන් වෙවුලන්නෝය. ඇමරිකාවේ සිටින අයට පිඹිදීමක් තිබෙනවා නම්, රාත්‍රී විකට නළුවන් සර්වබලධාරී දෙවියන් වහන්සේගේ ශුද්ධ කාරණා විහිලුවට හා උපහාසයට ලක් නොකරනු ඇත. දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය රාගය උපදවන කාරණා සොලවනු ලබන්නේය. ගැලවීම නොලැබුවා වූ අය දෙවියන් වහන්සේගේ දයාව උදෙසා මොරග සන්නෝය.

✸ **ධර්මිෂ්ඨයෝ ප්‍රීතිනන්නෝය** :- **"තවත් ගැන බලා සිටින අය උදෙසා ක්‍රියා කරන්නා වූ ඔබ හැර වෙන දෙවි කෙනෙක් ඇති බවක් පුරාණයේ සිට අසන්නට යෙදුනේවත්. කණට වැටුණේවත්, ඇසින් දකින්ට යෙදුණේවත් නැත. ප්‍රීතිවී ධර්මිෂ්ඨකව් කරන්නා වූ ඔබගේ මාර්ගවලදී ඔබ සිහිකරන්නා වූ අයට ඔබ සව්බවන සේක. මෙන්න ඔබ කෝපවූ ේක. අපි පව් කළෙවුව. බොහෝ කලක සිට අපි ඒවායේ පැවතුණෙවුව. අපට ගැලවීම ලැබේද ..?."** (යෙසායා 64 : 4-5) දෙවියන් වහන්සේට ඔබව මුණගැසීමට අවශ්‍යව තිබෙන සේක. දෙවියන් වහන්සේට පහලට පැමිණීමට අවශ්‍යව තිබෙන සේක. උන්වහන්සේ එලෙස ක්‍රියා කරන විට සභාව වෙහෙසකර තත්ත්වයට පත්වන්නේ නැත. දෙවියන් වහන්සේගේ සෙනඟ වචනයෙන් කිව නොහැකි ප්‍රීතිනේ සහ තේජසින් පූර්ණ වන්නෝය. ධර්මිෂ්ඨයන් ප්‍රීතිවන්නෝය. එය දැකීමට මම බොහෝ ආශාවෙන් සිටිමි. මගේ දරුවන් ද එය දැකීම මට අවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේව මුණ ගැසීමත් සමඟ වචනයෙන් කිව නොහැකි මෙම ප්‍රීතිය අවබෝධ කර ගැනීම මට අවශ්‍යව තිබේ. එසේ නම් දෙවියන් වහන්සේගේ මෙම උතුරා පිටාර ගැලීමට බාධා කරන්නේ කුමක්ද ... ?

(එඩිරියන් රොජර්ස් විසිනි) - (1931 - 2005)

පිඹිදීම වැළකීමට හේතුව අපි අපගේ පාපය කරුණුකොටගෙන දුෂිත වී සිටීමයි.

"අප සියල්ලෝම අපවිත්‍ර කෙනෙකු වෙන් වී සිටිවුව. අපේ සියළුම අධර්මිෂ්ඨකව්ද කිලුටු වස්ත්‍රයක් වෙන්ය. අප සියල්ලෝම කොළයක් වෙන් පාවෙවුව. අපේ අයුතුකව් ද සුළඟ වෙන් අප පහකාරගෙන යයි." (යොසායා 64:6) අපි තම ධර්මිෂ්ඨකම නැමති වස්ත්‍ර පැළඳගෙන සභාවට පැමිණෙන්නෙමු. අප වටා උද්දච්ඡකම සහ උඩඟුකම පවතින්නේය. අපගේ ජීවිතවල සියලු අපිරිසිදුකම් සහ වරද සඟවා ගන්නට අපි උත්සාහ කරන්නෙමු. අපගේ ධර්මිෂ්ඨකම උන්වහන්සේ දකින්නේ කිළුටු වැරහැල්ලක් මෙන්ය.

ඉතිරි කොටස ඊලඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මූලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.